## 2018/08/17 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2018.08.17 වන දින පෙ.ව. 09.00 ට නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය -**

| | |
|---|---|
| 1. නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. එම් කේ ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. ඩබ් ජී නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 4. සී වි සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 5. එච් ජී තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 6. කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 7. එච් කේ ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 8. එන් ජී ගයාන් මදුසංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 9. ධර්මසිරි ගණේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 10. පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 11. සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රී |
| 12. එඩේර ආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 13. නාපේ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 14. සී වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 15. විල්ලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 16. ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රී |
| 17. එම්. එම්. දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 18. එන්. ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 19. විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 20. කේ. කේ. අයි. නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 21. කේ ඒ සී දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රී |
| 22. එච් එච් ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රී |
| 23. වී ජී අරුණා ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. පී ජී රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

සුභ දවසක් වේවා! සියලුම ගරු මන්ත්‍රීවරුන්ට. අද දින නාගොඩ ප්‍රාදේශීය සභාවේ මහා සභාව ආරම්භ කිරීමට මත්තෙන්, සියලුම මන්ත්‍රීවරු තමන්ගේ ආගම සිහිකරන්න. ඒ එක්කම තමන්ගේ මියගිය දෙමව්පිය ඥාතිවරු, රට ජාතිය වෙනුවෙන් රටේ ඒකීයභාවය ආරක්ෂා කරන්න දිවිපිදූ රණවිරුවන්, ඒ වගේම ප්‍රාදේශීය සභාවේ හිටපු මියගිය සභාපතිවරුන්, මහජන නියෝජිතයන්, සියලු දෙනා සිහිකරල. විනාඩි දෙකක නිශ්ශබ්දතාවයක් ආරක්ෂා කරන ලෙස ඉල්ලා සිටිනවා.

**02. ගරු සභාපතිතුමාගේ පිළිගැනීමේ කතාව**

ගරු මන්ත්‍රීවරුනි නාගොඩ ප්‍රාදේශීය සභාවේ අද පවත්වන්නේ. පස්වෙනි මාසික සභාරැස්වීම. ඒ අනුව අද දින පැමිණි ගරු මන්ත්‍රී තුමන්ලා මන්ත්‍රී තුමියන්ල ඇතුළු මහජන නියෝජිතයන් ගෞරවයෙන් පිළිගන්නා අතර විශේෂයෙන්ම කියන්න ඕන. අපේ ප්‍රාදේශීය සභාව නියමිත පරිදි පවත්වන්නට තිබුණේ පසුගිය 14 වැනිදා අඟහරුවාදා. නමුත් එදින පවත්වන්නට නොහැකි වුණේ එදිනට අපේ ප්‍රාදේශීය සභාවේ ප්‍රසිද්ධ වෙන්දේසියක් සිදු කිරීමට නියමිතව තිබුණ නිසා. ඒ නිසා අපි කතා කරගෙන මාසික සභාවාරය 16 වෙනිදට කල් දමා 14 වෙනිදට වෙන්දේසිය සිදුකරන්න බලාපොරොත්තු වුණත්. යම් ප්‍රශ්නකාරී තත්ත්වයක් මතු වූ බැවින් වෙන්දේසිය ඉදිරි දිනයක දී පවත්වන්නට තීරණය කර 16 වෙනිදා සභා රැස්වීම පැවැත්වීමට කටයුතු කළ ද එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන සංවිධායක තුමා ඇතුළු කණ්ඩායමට ගරු අග්‍රාමාත්‍යතුමාගේ කැඳවීමක් මත කොළඹ යාමට සිදුවීම නිසා එතුමන්ලා අපෙන් ඉල්ලීමක් කළා. සභාව කල් දාන්න පුලුවන්ද කියලා. අපි එතුමන්ලගෙ ඉල්ලීමට ඇහුම්කන් දීලා සියලු දෙනාගේ කැමැත්ත අනුව මම තීරණය කළා. සභාව 17 වෙනිදට කල්දාන්න. ඒ අනුව අද දින සභාව පවත්වන්න තීරණය කළා. නමුත් අදත් අතිගරු ජනාධිපතිතුමා කැදවීමක් කරලා තියෙන නිසා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු තිදෙනාට සහභාගී විය නොහැකි බැවින් එතුමන්ලාත් ඉල්ලීමක් කළා. සභාව කල් තබමුද කියලා. මම එවෙලෙ කිව්වා දෙපාරක් කල්දාපු නිසා එසේ කිරීම අපහසුයි කියලා. එහෙම කළොත් කවුරුත් අපහසුතාවයට පත්වෙන නිසා. ප්‍රශ්නයක් නැතුව අපි 17 වෙනිදට සභාවෙ කටයුතු කරමු කියලා. අපේ සභාවේ සියලුම මහජන නියෝජිතයින් සහිතව සභාව කරනවා නම් අපට අපේ ප්‍රශ්න ගැටලු ඕනෑම දෙයක් නිරාකරණය කරගන්න පුළුවන්කම තියෙනවා. අපි අද දින සභාව පවත්වන්නේ ඒ අනුව. එහෙමනම් නැවත වරක් අද පැමිණි සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ල ලේකම්තුමිය ඇතුළු සියලු දෙනා පිළිගනිමින් සභාවේ වැඩකටයුතු ආරම්භ කිරීමටයි සූදානම.

**03. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම.**

නෙරංජලී ගරු මන්ත්‍රීතුමිය විසින් පසුගිය සභා වාතර්ාවේ පහත සංශෝධන ඉදිරිපත් කරන ලදී.

**ගරු මන්ත්‍රිනී සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය ඉදිරිපත් කරන යෝජනා**

**උඩවැලිවිටිය කොට්ඨාශය**

I. තලාව හොරන්ගල්ල මාර්ගය
II. ගල්ලෙන්මුල්ල මාර්ගය
III. කොස්ඇට හේන සිට කුරුදු ජනපදය දක්වා
IV. ගල්ලෙනමුල්ල මුත්තවිල මාර්ගය

ඉහත සදහන් යෝජනා ගරු මන්ත්‍රිනී සුභාෂි මධුමාලි ඒකනායක මෙනවියගේ නමින් සටහන් වී ඇත්තේ ප්‍රමාද දෝෂයකිනි. එම යෝජනා ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතාගේ යෝජනා ලෙස නිවැරදි විය යුතුය.

**04. 2018.07.10 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇතිනම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම,**

එම සංශෝධන වලට යටත්ව සභා වාතර්ාව සභාව පිළිගතයුතු සත්‍ය වාතර්ාවක් ලෙස **ගරු මන්ත්‍රී ධමර්සිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහත්මා විසින් නිවැරදි කරන ලද සංශෝධිත වාතර්ාව ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**05. විශේෂ නිවේදන**

01. ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා, ගරු මන්ත්‍රී **බන්දුල සමන්ත හිරිමුතුගොඩ මහතා, ගරු මන්ත්‍රී ඩබ්. කේ.නෙලී මහත්මියට විෂය භාර අමාත්‍ය ෆයිසර් මුස්තාපා ගරු අමාත්‍යතුමාගේ කැදවීමකට අනුව අතිගරු ජනාධිපත්තුමා සහභාගි වන පළාත් පාලන ඉදිරි සංවධර්න කටයුතු සම්බන්ධ සාකච්ඡාවක් සදහා ක්‍රීඩා අමාත්‍යාංශයට යාමට සිදු වී ඇත. එබැවින් අපහට නිවාඩු අනුමත කර දෙන ලෙස ඉල්ලා එවා ඇති 2018.08.16 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

**02. පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය, දේශීය ණය සහ සංවධර්න අරමුදල මගින් ආදාහනාගාරය ඉදිකිරීමට සහනාදායි පොලී ප්‍රතිශතයක් යටතේ ණය මුදලක් ලබා දිය හැකි බවත් ඒ සදහා අදාල ලිපි ලේඛන සම්පූණර් කර එවන ලෙස දන්වා එවා ඇති 2018.07.23 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

**03. ශ්‍රී පඤ්ඤාලෝක මාවත ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාතර්මේන්තුව මගින් ඉදිරිපත් කර ඇති 2018.08.01 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

**04. වාරිමාගර් ඇල අවහිර වීම නිසා ගෝණදෙනිය උඩුගම මාගර්යට හානි සිදු වීම මැයෙන් දිස්ත්‍රික් වාරිමාගර් ඉංජිනේරු කායර්ාලය, ගාල්ල විසින් මෙම ඇල මාගර්ය මෙම වසරේ නඩත්තු වැඩසටහන යටතේ ප්‍රතිසංස්කරණය කිරීම ඉදිරියේදී සිදු කරන බව දන්වා එවා ඇති 2018.07.26 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

**05. 2018 අගෝස්තු මස 20 වන දින නාගොඩ රෝහලේ සෞඛ්‍ය වෛද්‍ය මධ්‍යස්ථානයේ පැවැත්වෙන ගභර්නී මාතා සැසිය සදහා උදේ තේ වේලක් ලබා දීමට නාගොඩ මහජන පුස්තකාලයේ පාඨක සමාජය කටයුතු සංවිධානය කර ඇති බව දන්වා සිටිමි.**

**06. මාපලගම බස් නැවතුම්පොල වැසිකිලි පද්ධතිය ඉදි කිරීම සම්බන්ධව දකුණු පළාත් මාගර්ස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් එවන ලද 2018.07.11 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

මෙම වැසිකිලිය ඉදිකිරීම සම්බන්ධයෙන් එම ඉඩමට පිටුපස ඉඩම් හිමියාගේ විරෝධතාවයක් පවතින බවද මේ සම්බන්ධව දේශපාලන අධිකාරිය ද මැදිහත් වී ඇති බවද සභාපතිතුමා විසින් සඳහන් කරන ලදී,

ඒ අනුව ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා, ගරු මන්ත්‍රී ධමර්සිරි ගනේවත්ත මහතා, ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා , මාපලගම තල්ගස්වල උඩුගම යටලමත්තේ කොහේවත් පොදු වැසිකිලියක් නොමැති බවත් විරෝධතාවයන් නොසළකා, මුදල් ආපසු නොයවා මෙම කටයුත්ත ඉතා ඉක්මණින් කිරීමට කටයුතු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

**06. සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

**01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිහාල් පතිනායක මහතා මගින්, බෝවිටියමුල්ල වදුරඹ පදිංචි බී. එල්.චන්ද්‍රපාල මහතා විසින් බෝවිටියමුල්ල පල්ලෙතොට නව පාලම ආසන්නයේ පිහිටා ඇති අනාරක්ෂිත බෝක්කුවක් සම්බන්ධව 2018.07.02 දිනැති ලිපිය සභාගත කරන ලදී**

ස්ථානීය පරීක්ෂාවක් සිදු කිරීමට යොමු කරන ලදී.

**02. තල්ගස්වල, නියාගම "පද්මසිරි" හි පදිංචි මාගේ සේවා දායකයන් වන කාරියවසම් හපුතන්ත්‍රි ගමගේ ආනන්ද පද්මසිරි සහ කාරියවසම් හපුතන්ත්‍රිගමගේ මහින්ද පද්මසිරි ගේ උපදෙස් මත ඔබ වෙත යොමු කෙරෙන දැන්වීමේ වග නම්, යනුවෙන් ශේෂ්ඨාධිකරණ නීතීඥ තරංගා ලියනාරච්චි මහත්මිය විසින් එවන ලද 2018.07.02 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

ගරු සභාපතිතුමා, මේක ගෝනදෙනිය පිට්ටනිය. ගබඩාවත් එක්ක තියෙන ඒ පිට්ටනියත් අපි සංවධර්නය කරල තියෙන්නෙ. මම මෙතුමාත් එක්ක කතා කළා. පෙර පාසල හදලා තියෙන්නෙත් ඒ ඉඩමෙයි කියල තමයි එයාල කියන්නේ. මම පෞද්ගලික කතා කළා. මම ඉදිරිපත් වෙන්නම් කියලා. එවෙලෙ සාධාරණ ක්‍රියාමාගර්යකට යන්න කැමැත්ත දුන්නා. ගිය වතාවෙ මේක ඉදිරිපත් කළේ නැහැ. එතුමත් එක්ක කතා කරන්න ඕන නිසා. එතුමා නැවත ඊයෙ කතා කළා. ඒකයි මේක ඉදිරිපත් කළේ මේකට මොකක්ද ගන්න තීරණය. එයාලා කියනවා එතන තිබුන පාරත් අපි පිට්ටනියට වහලයි කියලා.

ඒ සම්බන්ධව උප සභාපතිතුමා අදහස් දක්වමින් දැන් එයා අපි පිට්ටනියට පාර වහලයි කියලා කියනවා නම්, හේමචන්ද්‍ර විලේගේ සභාපති තුමා ඉන්දැද්දි එතුමගෙන් ලියුමක් අරගෙනනේ ලයිට් ගත්තේ පිට්ටනිය කොනෙන් පාරක් නැති හින්දනෙ. අපෙන් අවසර අරගෙන ලයිට්

ගත්තෙ. ඒ ගොඩනැගිල්ලට පාරක් තිබුන නම් ලයිට් ගන්න වෙලාවේ අවසර ගන්න ඕන නැහැනෙ.

ගරු සභාපතිතුමා, කරුණු ඉදිරිපත් කරලා අපි නීත්‍යානුකූලව කරගෙන යමු. නැත්නම් මෙතුමා සභාවට කැඳවා ගෙන සාකච්ඡා කරලා. ඔය විස්තරයත් කියලා අයිතිය තහවුරු කරගන්න එහෙම කරමු. එතන ඉස්සරහ ඉඩමත් අපේ. ඒකටත් නඩුවක් තියෙනවා. පසුගිය වතාවේ මමත් ලේකම්තුමියත් සහභාගි වුණා. එවිට උප සභාපතිතුමා කියාසිටියේ නීතිඥවරයා නඩුවට පෙනී නොසිටින බවට චෝදනාවක් ඇති බවයි. අරුණ ශාන්ති ගරු මන්ත්‍රී තුමියද කියා සිටියේ මෙහෙන් මුදල් ගෙවා ඇති බවත් නඩුව සඳහා නීතිඥ මහතා පෙනී නොසිට ඇති බවයි. සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ එසේ නොවන බවත් සෑම වාරයකම නීතිඥයෙකු පෙනී සිට ඇති බවයි. නමුත් අපිත් එදිනට ඉදිරිපත් විය යුතු බවයි. නඩුවෙහි අනෙක් පාශර්වකරුවන්ගේ මතය වූයේ. අපි ඉදිරිපත් නොවන බව වුවත් අපි වෙනුවෙන් අපේ නියෝජිතයකු ඉදිරිපත් වන බව ප්‍රකාශ කරන ලදී.

**03. දකුණු පළාත් මාගර් සංවධර්න අධිකාරිය, තවලම ප්‍රාදේශීය ඉංජිනේරු කායර්ාලය මගින් 2018.07.13 දිනැතිව ඇතුමලේ පෝද්දිවල මාගර්යේ වැසි දිනවලදී ජලය රඳා පවතින ස්ථාන සම්බන්ධව එවන ලද ලිපිය සභාගත කරන ලදී.**

මේ සම්බන්ධව ගරු සභාපතිතුමා, අපි සම්බන්ධීකරන කමිටුවෙදි කතා කරල ඒ කටයුතු සිදුවෙමින් යන්නෙ.මේක සංවධර්න කමිටුවට අදාළ දෙයක් ඒ නිසා මේ ගැටලුව සංවධර්න කමිටුවෙ කතා කරන්න යොමු කරනවා. අපට දැනගැනීම සඳහා පිටපතක් එවල තියෙන්නෙ. ඉදිරි සංවධර්න කමිටුවෙදි මේ සම්බන්ධව කතා කරාවි යනුවෙන් ප්‍රකාශ කළේය.

**04. වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගරු පාලර්මේන්තු මන්ත්‍රී නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමා විසින් උඩුගම මහජන ශ්‍රවනාගාරය නොමිලේ ලබා ගැනීම - 2018 සැප්තැම්බර් 16 මැයෙන් 2018.07.03 දිනැතිව එවන ලද ලිපිය සභාගත කරන ලදී.**

මේ සම්බන්දව ගරු සභාපති තුමා අදහස් දක්වමින්,උඩුගම අපේ ශ්‍රවණාගාරය පෞද්ගලික අය සඳහා රුපියල් 15000 ක ටත් පාසල් සඳහා රුපියල් 10000 ක ටත් ලබාදෙන බව ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා කියා සිටියේ මහජන ශ්‍රවනාගාරය ලබාදිය යුතු බව හා එය නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලා සිටියේය. ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා, ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා, ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා, ගරු මන්ත්‍රී තරංග සුදශර්න මහතා ශ්‍රවණාගාරය නොමිලේ ලබාදීම සුදුසු බව දක්වමින් දීඝර් ලෙස කරුණු දක්වන ලදී.

මේ සම්බන්ධව ගරු උප සභාපතිතුමා තම අදහස් ප්‍රකාශ කරමින් කියා සිටියේ විවිධ සංස්කෘතික මධ්‍යස්ථාන තිබුනත් මේ කලාව දැන් අභාවයට යමින් පවතින බවයි. ගරු සභාපති

තුමනි, මේ කලාව දැන් අභාවයට යනවා. ගාල්ලෙත් දැන් නැහැ. කරාපිටියෙ විතරයි තාම ටිකක් තියෙන්නේ. මම කියන්නේ සම්පූර්ණ නිදහස් කරන්න නෙවෙයි. යම් කිසි කාලයක්, නරඹන පිරිසක් මේකට හුරු කරගන්නකම් යම් සහනයක් දෙන්න ඕන. ඒ වගේම මේකෙ නඩත්තුව සඳහා අපේ කම්කරුවන් යෙදෙව්වත් අපට යම් කිසි මුදලක් වැය වෙනවා. ජලය විදුලිය සඳහා මුදලක් වැය වෙනවා. ඒ පිළිබඳවත් අපේ ගරු මන්ත්‍රීතුමන්ල කල්පනා කරලා,නොමිලේ නෙවෙයි මම කියන්නෙ, නොමිලේ දුන්නම ජල බිල, විදුලි බිල, ශුද්ධ පවිත්‍ර කරන්න යන වියදම ආදී නඩත්තු වියදම් දරන්න අමාරුයි. ඒ නිසා හැමදාටම නෙවෙයි යම්කිසි රසික පිරිසක් හදාගන්නකම් යම් සහනදායී වැඩපිළිවෙලකට යනවනම් හොඳයි කියලා මම හිතනවා.

සම්බන්ධව ගරු සභාපතිතුමා කියා සිටියේ මේක අපේ පළවෙනි වැඩේ ඒක නිසා අපි විශේෂ තීන්දුවක් අරගෙන, ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති වරයෙක්, නියෝජ්‍ය අමාත්‍යවරයෙක් වශයෙන් අපෙන් ඉල්ලීමකුත් කරල තියෙනව.මේ සභාවෙ මන්ත්‍රී වරයෙකුත් මේකෙ ක්‍රියාකාරී සාමාජිකයෙක්,ඒ සියලු දේ සලකා බලල අපි අවසන් තීරණයකට එමු. මේක දෙන්නෙ රු.15000.00 කට එහෙම නැතුව සභාවේ කැමැත්ත අනුව රුපියල් 5000 ක් අය කරල රංගන ශාලාව ලබාදෙමු කියල මම යෝජනා කරනවා. මොකද නොමිලේම දෙන්න බැරි නිසා.

මෙම ඉල්ලීම සම්බන්ධයෙන් සභාපති තුමාගේ යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලද අතර ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතාගේ ද එකඟතාවය පලවීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**05. සෙනවිරත්න මාවත, කැප්පිටියාගොඩ, නාගොඩ ලිපිනයේ පදිංචි ඩබ්. පී.ජී. හද්‍රා මහත්මිය විසින් අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම යනුවෙන් ඉදිරිපත් කර ඇති 2018.08.02 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

මේක වෙලා තියෙන්නේ සල්ලි බැඳලා ගිහිල්ලා තිබුනා.අපේ සභාවෙන් ගස් පරික්ෂා කරන්න යනකොට ඒ ගස් කපලා දැන් ඒ අය අපට ගෙවූ මුදල් ආපසු ඉල්ලනවා.

ඒ සම්බන්ධව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා, ඒ අය අනතුරු නිසා ගස් කපන්න ඇති. සභාවෙන් ගස් බලන්න ගියෙ කවදාද යන්න විමසන ලදී.

එවිට ගරු සභාපතිතුමා කියා සිටියේ ගස් බැලීමට ගිය දිනය නම් මම දන්නෙ නැහැ. 2018/07/09 දින තමයි මුදල් බැඳලා තියෙන්නේ. මේ ලියුම මගෙ අතටම දුන්නා. අපට ගෙවපු මුදලක් ආපහු ගෙවන්න විදියක් නොමැති බව ප්‍රකාශ කළේය.

**06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ J.C.B. යන්ත්‍රය වෙන්දේසි කිරීම සම්බන්ධවයි යනුවෙන් දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කරන ලද 2018.08.10 දිනැති ලිපියෙහි පිටපත සභාගත කරන ලදී.**

**J.C.B.** යන්ත්‍රය වෙන්දේසි කිරීම සඳහා සියලු කටයුතු සූදානම් කර තිබියදී ගරුමන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් ඒ සම්බන්ධව පැමිණිල්ලක් කොමසාරිස්තුමා වෙත ඉදිරිපත් කර ඇත. කොමසාරිස්තුමා ගෙන් විමසූ විට. ගැටලුවක් නොමැති බවත් එය වෙන්දේසි කරන ලෙසත් දුරකථනයෙන් දැනුම් දුන්නා. නමුත් ඊයේ දිනයේ තිබුණු සභාවත් කල්තබා අද දින සභාව යොදා ගත්තේ මේ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා සහබන්දු මහතා සිටිය යුතු නිසා. පෙත්සම ඉදිරිපත් කළ සහබන්දු මහතා ට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන ලදී.

ඒ සම්බන්ධව මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා තම අදහස් ප්‍රකාශ කරමින් **J.C.B.** යන්ත්‍රය ගාල් කරන අවස්ථාවේ ධාවනය කරන තත්වයේ පැවතුන බව අපි දන්නවා. එම අවස්ථාවේ යන්ත්‍රය තිබුණු තත්ත්වය, ධාවන සටහන් රියදුරු විසින් සම්පූර්ණ කර ඇත්ද යන්නත්, නිලධාරීන් එම යන්ත්‍රය පරීක්ෂාකර සටහන් යොදා ඇත්ද යන්නත්, පරීක්ෂා කළ යුතුයි. මෙම යන්ත්‍රයේ ගාල් කළාට පසු එහි කොටස් ගලවා ඉවත් කළා කියලා මතයක් පවතිනවා. එම අවස්ථාවේ එහි සිටි මුරකරුවන් පිළිබඳව නිසි පියවර ගත යුතුයි.

මෙහි වයිපර් මෝටරය, හෝස් එක ගලවලා කියලා කියනවා. මේ අවස්ථාවේ මුරකරුවෝ සිටියා නම් ඔවුන් පිලිබඳ ක්‍රියාමාගර් ගත යුතුයි. මෙය වෙන්දේසි කිරීම සඳහා. මම කොමසාරිස්තුමාට කතා කළාම එය අවුරුදු පහක් පමණ පරණ නිසා එය අල්ලලා දාන්න කිව්වා. අමාත්‍යාංශ ලේකම්ට කතා කළාම ඔබලාත් ඒ සඳහා වගකිව යුතුයි කිව්වා. මේ සම්බන්ධයෙන් මුරකරුවන් සඳහා ගත්ත තීන්දුව කුමක්ද? කමිටුවක් පත්කර තීන්දුවක් ලබා ගන්න. වෙන්දේසි කිරීමට විරුද්ධ නැහැ. සභාපතිතුමා කිසිදේකට සම්බන්ධ නැහැ. ලේකම් මිස් එක්කවත් කා එක්කවත් තියෙන ප්‍රශ්නයක් නෙවෙයි. මේක රාජ්‍ය භාණ්ඩ. මේවා ආරක්ෂා කරගත යුතුයි.

මේ සම්බන්ධව ගරු මන්ත්‍රී ලක්රුවන් මහතා ප්‍රකාශ කළේ මුරකරුවන් නොසිටි කාලයක් තිබුන නිසා මුරකරුවන් සඳහාම මෙම චෝදනාව එල්ල කළ නොහැකි බවයි.

මේ සම්බන්ධව ගරු සභාපතිතුමා තම අදහස් දක්වමින්, මෙම **J.C.B.** යන්ත්‍රය 2011 වෂර්යේ නිතර නිතර හෝස් කැඩෙන්න පටන් ගත්තා. අපි සභාවේ සිටින විට මෙහි අලුත්වැඩියා කටයුතු සඳහා ඇස්තමේන්තුවක් ලබාගන්න කියලා කරපු ඉල්ලීමට සෙනොක් ආයතනයෙන් ලක්ෂ 11 ක ඇස්තමේන්තුවක් ලබාදුන්නා. එම මුදල ඉල්ලා ප්‍රධාන අමාත්‍ය තුමාට ලිපි යවා ඇතත් මුදල් ලැබිල නැහැ. සභාවේ මුදල් නොමැති නිසා යන්ත්‍රය එම ස්ථානයේ ගාල් කර දීඝර් කාලයක් තිබුණා. අවුරුදු ගානක් එක තැන තිබිලා තමයි මෙම තත්වය ඇතිවෙලා තියෙන්නේ. 2014 පැවති සභාවෙන් වෙන්දේසි කිරීමට තීරණය කර පළාත් පාලන දෙපාතර්මේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු වාතර්ාව අනුව ටෙන්ඩර් කැඳවීම් කලත් ටෙන්ඩර් කිසිවක්ඉදිරිපත් වී නැත. පසුව ප්‍රධාන ලේකම් කායර්ාලයේ නිලධාරීන් පිරිසක් පැමිණ පරීක්ෂාකර තක්සේරු වාතර්ාවක් ලබා දී ඇත. ඒ අනුව වෙන්දේසි කිරීමට තීරණය කරන ලදි. එම ස්ථානයේ දිවා මුර සේවයක් තිබිලා නැහැ. රාත්‍රී කාලයේ පමණක් මුර සේවයක් පැවතුනි.මෙම වෙන්දේසිය හොර රහසේ වුනේ නැහැ. ජුනි 10 දින සභාවාරයේ වෙන්දේසි කිරීමේ යෝජනාව සභා සම්මත විය.

ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා තම අදහස් දක්වමින් සහබන්දු මහතා මේ කරන චෝදනාව අනුව අපි පසුගිය සභාවේ විපක්ෂයේ සිට මොකුත් කතා කරලා නැහැ වගේ. ඒනිසා සියලු

සංවර්ධන කටයුතු නවතා හෝ මේ වත්කම් හා භාණ්ඩ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා ලබන සභාවට වාතර්ාවක් ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කළේය.

ගරු උප සභාපති තුමා අදහස් දක්වමින් ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි සහබන්දු මන්ත්‍රිතුමාගේ මේ දිගින් දිගටම කරන කතා අපට නීරසයි. මොනම ක්‍රමයකින් හරි මාස දෙකක් තුනක් ඇතුලත මේ සම්බන්ධ වාතර්ාවක් ඉදිරිපත් කරන්න. මේ සභාව කරගෙන යන්න. ඔය පරණ කෝන්තර කුණුගොඩවල් ගේන්න එපා. සහබන්දු මහතා සභාපතිධූරය දරපු කාලෙත් ගැටලු තිබුණා. හැම සභාවකම පරණ කුණු අවුස්සනවා මිසක් වෙනවැඩක් කරන්නේ නැහැ. මන්ත්‍රීවරුන්ගෙන් යම් කණ්ඩායමක් පත් කරගෙන පරීක්ෂණයක් කර වාතර්ාවක් සභාවට ඉදිරිපත් කරන්න. හැමදාම පරණ දේවල් කතා කරන එක තේරුමක් නැහැ.

සභාපතිතුමා, මේ සම්බන්ධව කමිටුවක් පත් කර ගන්න. මාස දෙකක් ඇතුළත වාතර්ාවක් ලබා දෙන්න. යනුවෙන් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව නිශ්චල හා චංචල දේපල සමීක්ෂණ කමිටුව සඳහා ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා, ගරු මන්ත්‍රීනි අරුණ ශාන්ති මහත්මිය, ගරු මන්ත්‍රී තරංග සුදශර්න මහතා, ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා විසින් ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතාගේ නම යෝජනා කරන ලදී. ගරු මන්ත්‍රීනී නෙරන්ජලී මහත්මිය විසින් ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතාගේ නම යෝජනා කළ අතර ගරු මන්ත්‍රී එන්.වී. සමන් මහතා විසින් ගරු උප සභාපති තුමාගේ නම සහ ගරු මන්ත්‍රී ධමර්සිරි ගනේවත්ත මහතාගේ නම යෝජනා කරන ලදී. ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රී එම්.එම්. දිසානායක මහතාගේ නම යෝජනා කරන ලදී.

07. **ප්‍රාදේශිය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කායර්ාලය, නාගොඩ විසින් 2017 මැයි මස ඇති වූ ගංවතුර හා නායයෑම් හේතුවෙන් නැවත පදිංචි කරන ජනතාවගේ නිවාස සැළසුම් අනුමත කර ගැනීම යනුවෙන් ඉදිරිපත් කරන ලද 2018.08.06 දිනැති ලිපියෙහි පිටපත සභාගත කරන ලදී.**

**07 යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ**

නැත.

**08. යථා පරිදි කල් දී ඇති යෝජනා**

1. **2018 පළාත් පාලන ආයතන සඳහා තේරී පත් වූ ගරු මහජන නියෝජිතයින් සඳහා වූ පුහුණු වැඩමුළුව සඳහා ප්‍රවාහන හා අනෙකුත් වියදම් මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව සභා අරමුදලින් වියදම් දැරීමට අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කරමි.**

   ගරු සභාපතිතුමා මේ සම්බන්ධව අදහස් ප්‍රකාශ කරමින් පුහුණුව සඳහා හෙට උදේ 4 ට පිටත්වන බවත්, උදේ කෑම ලබා දෙන බවත්, දවල් කෑම සඳහා එම ස්ථානයට යා යුතු

බව හා මෙම වැඩසටහන ඉතා වටිනා එකක් ඒ වගේම අපේ සුහදත්වය වර්ධනය කර ගන්න හොඳ අවස්ථාවක් බවත් කියා සිටියේය. මේ සඳහා වාහනය සහ මග වියදම් සඳහා රු. 60000.00 ක මුදලක් වැය වෙතැයි අපේක්ෂා කරන බැවින් අනුමැතිය සඳහා යැවීමට යෝජනා කරමි.

**ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ගෙනා එම යෝජනාවට ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් සභාවේ අනුමැතිය ලබාදෙන බව ප්‍රකාශ කරන ලදී.**

2. **තල්ගස්වල පොල සමග පැවති ඉඩම පොදු අරමුදලේ මුදල් වැය කර J.C.B. යන්ත්‍රයක් යොදා පිළිසකර කිරීමට යෝජනා කරමි.**

   තල්ගස්වල පොළ භූමිය J.C.B. යන්ත්‍රයක් දමා ප්‍රාදේශීය සභා පොදු අරමුදලින් වියදම් දරා ශුද්ධ කිරීමට **ගරු සභාපතිතුමා කල යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

3. **නාගොඩ බස් නැවතුම්පොල අබලන් තත්වයට පත් වී ඇති බැවින් එම ස්ථානයේ නව බස් නැවතුම්පොලක් ඉදිකිරීමට යෝජනා කරමි.**

සභාපතිතුමා අදහස් දක්වමින් නාගොඩ බස්නැවතුම්පොළ අබලන් වෙලා තියෙන්නේ. ඒක අනතුරුදායකයි. එතන නව බස් නැවතුම්පොළක් හදන්න ඕන. නැත්නම් තියෙන එක අලුත්වැඩියා කරන්න ඕන. **ඒ සම්බන්ධව පළාත් මාගර්ස්ථ මගී ප්‍රවාහන අධිකාරිය දැනුවත් කිරීමට කටයුතු කරනවා.**

4. **ලෝක ළමා දිනය වෙනුවෙන් අප පෙර පාසල් 15 ක දරුවන් සඳහා උපුල් මාමාගේ විවිධ ප්‍රසංග වැඩසටහන තුළින් දැනුම , රසවින්දනය ලබාදීමට යෝජනා කරන අතර අප ආයතනයේ ලෝක ළමා දින උත්සවය 2018 ඔක්තෝම්බර් මස 05 වන දින පැවැත්වීමට අපේක්ෂා කරන අතර ලෝක ළමා දින උත්සවයේ වියදම් දැරීමට සභා අරමුදලින් රු. 125000.00 ක් වැය කිරීමට යෝජනා කරමි.**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, බල ප්‍රදේශයේ අනිකුත් ළමයි සම්බන්ධ කර ගන්න කියලා යෝජනාවක් ආවා. නමුත් වියදම වැඩි වෙන නිසා සභාවේ ළමයින් පමණක් මෙයට සම්බන්ධ කර ගෙන උත්සවය පැවැත්වීමට තීරණය කරන ලදී. මේ සඳහා උපුල් මාමා ගෙන්වීමට රු. 35000.00 ක් වැය වේ. ළමුන් 395 ක් වෙනුවෙන් මෙම උත්සවය සඳහා රු. 125000.00 ක් වැය වේ.

**ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ගෙනා එම යෝජනාවට ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා අහන්ගම ප්‍රදේශයේ ඇස් දෙකම පේන්නෙ නැති ළමා ගායකයෙක් සිටින බවත් ඒ ළමයා මේකට සම්බන්ධ කර ගන්න පුලුවන්නම් විශාල ආදශර්යක් වන බවත් ප්‍රකාශ කරන ලදී.

5. ඊළඟට මන්ත්‍රීතුමන්ලා අපේ ප්‍රාදේශීය ලේකම් කායර්ාලයෙන් එවලා තියෙනවා 2017 මැයි මස ඇති වූ ගංවතුර හේතුවෙන් නැවත පදිංචි කරන ජනතාවගේ නිවාස සැලසුම් අනුමත කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් සභාවට දන්වා ඇති අතර . එම නිවාස හිමියන්ගෙන් දඩ මුදල් නිදහස් කරන ලෙස ඉල්ලීම් කර ඇත.

මෙහිදී ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා කියා සිටියේ ඉඩම දීල තියෙන්නෙ විපතට පත් වෙච්ච නිසා. දීල තියෙන්නෙ සහනාධාරයක් ලක්ෂ 12 ක ලක්ෂ 12 ගෙන් ගේ හදා ගන්න බැහැ. ඒ නිසා සාධාරණයක් කරන්න ඔබතුමාලට සල්ලි ඕන නම් සභාවෙ තීරණයක් අරගෙන කරන්න යනුවෙනි. එහිදී ගරු මන්ත්‍රී චන්ද සහබන්දු මහතා සානුකම්පිතව සලකා **බලා සභාවේ ඒකමතික තීරණය අනුව නිදහස් කරන ලෙස යෝජනා කරන ලදී . ගරු මන්ත්‍රී තරංග සුදශර්න මහතාද ඒ අදහස ස්ථිර කරන ලදී.**

මෙහිදී ගරු සභාපතිතුමා තව දුරටත් අදහස් ප්‍රකාශ කරමින්, ප්‍රාදේශීය ලේකම් තුමිය සද්භාවයෙන් මෙම දඩ මුදල් නිදහස් කරන ලෙස ඉල්ලල තියෙන්නෙ. ඒ නිසා තොරතුරු සොයල බලල අපට කරන්න පුලුවන්දේ කරන්නම්.මොකද ඒ අයත් විපතට පත් වුන අය. අපේ කමිටුවෙන් තීරණයක් අරගෙන කියන්නම් යනුවෙන් ප්‍රකාශ කරන ලදී.

## 8.1 ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා

1. **බල ප්‍රදේශයේ සභාව සතුව පවතින වත්කම් හදුනාගැනීමට ස්ථාවර වත්කම් සමීක්ෂණයක් සිදු කල යුතු අතර ඒ සඳහා ගරු මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත කමිටුවක් තොරා පත් කර ගන්නා ලෙස යෝජනා කරමි.**

   සභා බල ප්‍රදේශයේ සභාව සතුව පවතින වත්කම් හඳුනාගැනීමට ස්ථාවර වත්කම් සමීක්ෂණයක් සිදු කිරීම අවශ්‍ය බව ප්‍රකාශ කරන ලදී. මෙහිදී සභාපතිතුමා ඒ සම්බන්ධව වැඩිදුරටත් අදහස් දක්වමින්,මේක යෝජනාවක් ලෙස සභාවට ඉදිරිපත් කළේ අපේ තියෙන ස්ථාවර වත්කම් මොනවද කියල ඉදිරිපත් කරනන කියල සභාවට දන්වල තියෙනවා. දැන් කොට්ඨාසයට මන්ත්‍රීවරු ඉන්න නිසා තමන්ගේ කොට්ඨාසෙ තියෙන අපේ වත්කම් මොනවද කියලා ඒ අය දන්නවා. ඔබතුමන්ල දන්න ස්ථාවර වත්කම් ඉදිරිපත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මොකද අපේ සභාවට අයත් අපි නොදන්න වත්කම් තියෙනවා.

**2. එළඹෙන සාහිත්‍ය මාසය මුල් කර ගෙන සාහිත්‍ය නිමර්ාණ තරගාවලිය සඳහා නිමර්ාණ යොමු කරන ලද පාසල් දරුවන්ට හා නාගොඩ බල ප්‍රෙද්ශයේ අනිකුත් ප්‍රජාවට 2018 සැප්තැම්බර් මස 01 දින සිට සැප්තැම්බර් 31 දක්වා කාලය තුල පුස්තකාල සාමාජිකත්වය නොමිලේ ලබා දීමට යෝජනා කරමි.**

**සභාපතිතුමා විසින් කරන ලද ඉහත සදහන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**3. ආර්. ඒ.ඒ.එල්. රත්නායක මහත්මියට පරිසර විෂය පවරා ඇති බැවින් පරිවථරීත ගමන් වියදම් දීමනාව හා ක්ෂේත්‍ර දීමනාව ලබා දීමට යෝජනා කරමි.**

ගරු සභාපතිතුමා මේ පිළිබඳව අදහස් දක්වමින් අප ප්‍රාදේශීය සභාවේ රත්නායක මහත්මිය දරු ප්‍රසූතියෙන් පසුව සේවයට වාතර්ා කළ පසු ක්ෂේත්‍ර නිලධාරිනියක් හැටියට පත් කළ බවත් ඇයට රුපියල් තුන්දාහක ක්ෂේත්‍ර දීමනාව ලබාදීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස දන්වන ලදී.

**සභාපතිතුමා විසින් කරන ලද ඉහත සදහන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**4. නාගොඩ ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාල සඳහා පරිගණක පහසුකම් ලබා ගැනීමට යෝජනා කරමි.**

මෙම යෝජනාව යටතේ ගරු සභාපතිතුමා සහ ගරු උප සභාපතිතුමාගේ අදහස වූයේ ලැබුණු පරිගණකය නාගොඩ ප්‍රධාන පුස්තකාලයට ලබා දී අනෙකුත් පුස්තකාල දෙක සඳහා පරිගණක දෙකක් මිළදී ගන්නා ලෙසය.

**සභාපතිතුමා විසින් කරන ලද ඉහත සදහන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

5. **උඩුගම උප කායර්ාල භූමියෙහි ඇති බහුකායර් ගොඩනැගිල්ලේ ආරක්ෂාව තහවුරු කිරීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා සභා අරමුදලින් වියදම් දැරීමට යෝජනා කරමි**.

මේ සම්බන්ධව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා අදහස් ප්‍රකාශ කරමින් කියා සිටියේ ඔය සම්බන්ධව මීට පෙරත් අදහස් ප්‍රකාශ කර ඇති බවයි. ඒ පැත්තට යන මිනිස්සු ගමන් කරන්නේ පුරනැගුම කායර්ාලය හරහා. එම ස්ථානයේ වැටක් ගේට්ටුවක් නැහැ. ඒ නිසා මුරකරු මේ සම්බන්ධව කියන්න කලින් මම ඔය පිළිබඳව දැනුවත් කළා. මේක අපේ සම්පතක් ඒක ආරක්ෂා කර ගැනීම සඳහා නිශ්චිත වැඩපිළිවෙළක් අවශ්‍යයි. එබැවින් ලිපිය පිළිබඳව අවධානය යොමුකර ආරක්ෂිත වැට ඉදි කරන්න පියවර ගන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, මේක ඉදිරිපත් කරලා තියෙන්නේ සභා අරමුදලින් ඉටුකරන්න ඒ සඳහා ඔබතුමන්ලගේ යෝජනා ස්ථිරත්වය ලබා දෙන්න යනුවෙන් ඉල්ලා සිටින ලදී.

**ගරු සභාපතිතුමා විසින් කරන ලද එම යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.**

ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා යෝජනා කර සිටියේ ආරක්ෂිත කැමරා පද්ධතියක්සවි කරන ලෙසයි. එවිට මෙහි මුරකරු ඉන්නවද කියලා බලාගන්නත් පුළුවන්. එයට පිළිතුරු දුන් ගරු සභාපතිතුමා එම යෝජනාව හොඳ බවත් යථා කාලයේදී මේ සම්බන්ධව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බවත් පවසන ලදී.

**06. ගරු මන්ත්‍රීතුමන්ලා මගේ තව යෝජනාවක් තියෙනවා. මේ කසල ප්‍රශ්නය ලොකු ප්‍රශ්නයක්.** පසුගිය දවස්වල එහෙම ප්‍රශ්නයක් ඇති වුණා. උඩුගම බල ප්‍රදේශයේ වෛද්‍යවරයෙක්ගේ කසල ගත්තෙ නැහැ කියල. නමුත් අපි ගිහිල්ලා බැලුවාම එතුමා ලස්සනට කසළ වෙන් කරල තියනව. නමුත් යන අය ඒක ගිහිල්ලා ගන්න ඕන. ඒකට ඒ අය කැමැත්තක් දැක්වුවේ නැහැ. මොකද එහෙම ගියාම අනිත් තැන්වලිනුත් ගිහිල්ලා ගන්න කියනවලු. ඊට පස්සේ ඔය ප්‍රශ්නෙදි මම ගිහිල්ලා මැදිහත් වෙලා කතා කළා. ඒ දොස්තර මහත්තයා එවෙලෙ ටිකක් වේගවත්ව කතා කළා. මමත් වේගවත්ව කතා කළා. මම ගිහිල්ලා බැලුවා බලලා මටත් බේර ගන්න බැහැ. නමුත් ඒක සමථයකට පත් කරලා ආවත් කසල අරගෙන නැහැ. පස්සේ ඒ සම්බන්ධව සොයා බලන්න ලේකම්තුමිය යැව්වා. දෙපැත්තෙ කඩවල් හිමියොත් එකතුවෙලා. ඊට පස්සේ මට දැනගන්න ලැබුණා. මෙහෙමයි මට පැමිණිළි එනවා. එක තැනක ගන්නත් තව තැනක නොගන්නත් ඇයි කියලා. එවිට එයාලා කිව්වා අපි මුදල් දෙන්නම් කියලා. අපි එහෙම මුදල් අරගෙන කන්නැලියේ කුණු ගන්නවා. ඊට පස්සේ අපි මේ ගැන සම්මන්ත්‍රණයකදී කතා කරනකොට මට දෙණියායෙ කොටපොළ ප්‍රාදේශීය සභාවෙ ගරු සභාපතිතුමා මුණ ගැහුණා. එතුමන්ලා කසල බද්දක් හැටියට හෝටලයකින් යම් මුදලක්, තේ කඩයකින් යම් මුදලක්, ගෙවල් වලින් යම් මුදලක් අරගෙන කසල එකතු කිරීමේ වැඩසටහන කරන බව කිව්වා. කසල බද්දට හොඳ ප්‍රතිචාර තියෙන බවත් පැවසුවා. ඒ නිසා අපේ බල ප්‍රදේශයේ පහුගිය දවස් වල ලක්ෂ 5ක් වියදම් කරල ඇප්තොප් වත්තේ කසල ප්‍රතිචක්‍රිකරන මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කරලා යම් ප්‍රවණතාවයකට ඇවිල්ල තියෙනවා. ඒ පාරත් දැන් හදලා යන්න පුළුවන්. ඒ අනුව දැන් අලුත් වත්තෙ කසල ගේන්නේ නැහැ කියලා ප්‍රශ්නයක් ආවා. ඌරලට එන්නේ නැහැ කියලා සමිතියකින් මට පැමිණිලි කළා. ඒ කියන විදියට කසල ගෙනැල්ල අපට ප්‍රතිචක්‍රියකරණය කරන්න මම යෝජනා කරනවා. එවැනි වැඩපිළිවෙලකට අපි යා යුතුයි කියලා. ඔබතුමන්ලගේ අදහසුත් මම බලාපොරොත්තු වෙනවා. ඉදිරියේදී ඒ වැඩපිළිවෙළ සකස් කරල අපි ඉදිරිපත් කරන්න ද? නැත්නම් ඔබතුමාලගේ යෝජනා අදහස් ඉදිරිපත්කරන්න. වරිපනම් බදු වලටත් වැඩ පිලිවෙලක් කරගන්න බැරි වුණා. ඉදිරියේදී කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ සම්බන්ධව ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා, මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා, ගරු මන්ත්‍රී අරුණ ශාන්ති මහත්මිය, ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා තම අදහස් ප්‍රකාශ කරන ලදී.

- **ඉහත යෝජනා සියල්ල සඳහා සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා ඒකමතිකව සභා සම්මත විය.**

- **8.2 කර්මාන්ත යෝජනා**

**දකුණු පළාත් සභා මන්ත්‍රී සුමනසිරි ලියනගේ මැතිතුමාගේ යෝජනා - මන්ත්‍රී ප්‍රතිපාදන 2017**

I. ගෝණාදෙනිය යහල්දූවවත්ත පාර තාර අවසන් වූ තැන සිට වසන්ත මහතාගේ නිවස අසල මංසන්ධිය දක්වා ප්‍රතිසංස්කරණය කිරීම
II. හෝමදොල නො.65 මාර්ගයේ කෙටලපද්දල මාර්ගයේ මහ වංගුවේ සිට කොන්ක්‍රීට් පාර තෙක් කාණුව කැපීම
III. ගෝණාදෙනිය දොල ඉහළ කන්ද - පාසල් ගොඩකන්ද යා කරන මාර්ගය කාණු කපා මට්ටම් කිරීම
IV. ගෝණාදෙනිය දොල ඉහළ කන්ද ප්‍රසාද් මහතාගේ නිවස අසළ සිට උපුල් මහතාගේ නිවස දක්වා කාණුව ඉදි කිරීම
V. දිසානායක මාවත අතුරු මාර්ගය තුංමං හංදිය සිට සිරිල් මහතාගේ නිවස දෙසට මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම

**ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග කි.මී. 1000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන-2017 යටතේ ගරු නියෝජ්‍ය අමාත්‍ය නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමාගේ යෝජනා**

VI. උඩලමත්ත සිට 52 කොටස දක්වා මාර්ගය සංවර්ධනය කිරීම
VII. හගරන්විල සිට ඇල්ල හේන දක්වා මාර්ගය සංවර්ධනය කිරීම

**8.3. ගරු සභාපතිතුමන් හා මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා**

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

I. ඉවත් කරන ලද ලයිට් කණු මිළදී ගැනීමට යෝජනා කරමි.
II. උඩලමත්ත දිමුතු වෙළදසැල බීරිගෙවත්ත මාර්ගය වාඩියගොඩ හගරන්වල මාර්ගය දක්වා ප්‍රාදේශීය සභා මාර්ගයක් වශයෙන් පවරා ගැනීමට යෝජනා කරමි.
III. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ගයන් සදහා අවශ්‍ය සිළිංඩර් ලබා ගැනීමට යෝජනා කරමි.
IV. උඩලමත්ත අකුලහේන ප්‍රාදේශීය සභා පොදු නාන ළිද අළුත්වැඩියා කිරීමට යෝජනා කරමි.
V. J.C.B. යන්ත්‍රයක් මිළදී ගැනීම සදහා දේශීය ණය යෝජනා ක්‍රමයෙන් ණය මුදලක් ලබා ගැනීමට යෝජනා කරමි.
VI. බණ්ඩාරනායකපුර බණ්ඩියහේන මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ඉහත සදහන් යෝජනා ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**ගරු මන්ත්‍රී විජිත් වීරගුණරත්න සහබන්දු මහතා ඉදිරිපත් කරන යෝජනා**

I. BD 5 කන්ද පාර J.C.B. යන්ත්‍රයක් යොදවා අලුත්වැඩියා කිරීම සදහා යෝජනා කරමි
II. යටලමත්ත පාසල් කන්ද පාර අලුත්වැඩියා කිරීම සදහා යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනා උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන ජයරත්න මහතා ඉදිරිපත් කරන යෝජනා**

I. ගෝණදෙනිය හිරිකුඹුරකන්ද සිට පාසල්ගොඩකන්ද අතුරු මාර්ගය සංවර්ධනය කිරීම
II. ගෝණදෙනිය කරදගොඩවත්ත ගෙදර මාර්ගය සංවර්ධනය කිරීම

**ඉහත සඳහන් යෝජනා ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රිනී එච්. එච්. ගයන්ති කුමාරි මහත්මිය ඉදිරිපත් කරන යෝජනා**

I. උක්ඕවිට ඇප්තොප්වත්ත කොම්පෝස්ට් මධ්‍යස්ථානය දක්වා මාර්ගයේ ඇප්තොප්වත්ත මාර්ගය ආරම්භයේ සිට 100m ක් කොන්ක්‍රීට් කිරීම සහ එම පාර දෙපස කානු පද්ධතිය සකස් කිරීම
II. 59 හේන සිට දවුල්හේනට ප්‍රවිශ්ඨ වන මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදවා ප්‍රතිසංස්කරණය කිරීම
III. උඩුගම ප්‍රධාන මාර්ගයේත්, අතුරු මාර්ගවලත් විධිමත් ලෙස වීථි පහන් සවි කිරීම

**ඉහත සඳහන් යෝජනා ගරු මන්ත්‍රී තරංග සුදශර්න මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රිනී බෝදරගමගේ අරුණ ශාන්ති මහත්මිය ඉදිරිපත් කරන යෝජනා**

I. නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නීතිවිරෝධි මත්ද්‍රව්‍ය විශාල ලෙස ව්‍යාප්ත වී ඇති බැවින් එම මත්ද්‍රව්‍ය මැඩපැවැත්වීම සුදුසු බව යෝජනා කරමි.

II. කුරුපනාව තේ කම්හල පාර ඉතාම අබලන් බැවින් එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම හෝ තාර ඇතිරීමට සුදුසු යැයි යෝජනා කරමි.

**III.** උක්ඕවිට කොට්ඨාශයේ උඩුගම ගබඩාව අසළ සිට බටහේන්ගොඩට ප්‍රවේශ වන ගොඩැල්ල මාර්ගය බාදනයට ලක් ව ඇත. ඒ සඳහා කඩිනම් විසදුමක් ගැනීම සුදුසු බව යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනා ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා ඉදිරිපත් කරන යෝජනා**

I. 215 අලුත් පහළ ග්‍රාම නිලධාරී වසමේ ගිංගඟ දෙපස ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දීමේ යෝජනා ක්‍රමයට නාගොඩ ප්‍රාදේශීය සභාවේ අනුග්‍රාහකත්වයක් ලබා දෙන ලෙස යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනා ගරු මන්ත්‍රී ධමර්සිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී පී. පී. රංජිත් ජයවීර මහතා ඉදිරිපත් කරන යෝජනා**

I. අප බල ප්‍රදේශයට අයත් ගිං ගගේ තොටුපළක් වන (සුකිරි මහත්මාගේ නිවස ඉදිරිපිට ඇති) ගගට බසින තොටුපළ ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස යෝජනා කරමි.

II. අප බල ප්‍රදේශයට අයත් නාගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ දැනට පුරප්පාඩුව පවතින සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුර සඳහා ඉතා ඉක්මණින් සහකාර ප්‍රාදේශීය ලේකම්වරයෙකු ලබා දෙන ලෙස නිසි බලධාරීන් දැනුවත් කිරීමට යෝජනා කරමි.

III. අප බල ප්‍රදේශයට අයත් කුඹුරුහේන මාර්ගයේ ඉතා අදුරු ස්ථාන කිහිපයක් ඇති බැවින් ඒ සඳහා වීථි පහන් 07 ක් සවි කර දෙන ලෙස යෝජනා කරමි.
**ඉහත සඳහන් යෝජනා ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රි ධර්මසිරි ගනේවත්ත මහතා ඉදිරිපත් කරන යෝජනා**

I. සංවර්ධන ගම්මනය කන්ද පාර සංවර්ධනය කිරීමට යෝජනා කරමි

**ඉහත සඳහන් යෝජනා ගරු මන්ත්‍රි පියල් හිරිමුතුගොඩ විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**යථා පරිදි කල් දී ඇති යෝජනා මන්ත්‍රීවරුන්ගේ යෝජනා සියල්ල චන්ද්‍ර සහබන්දු මහතා විසින් අනුමත කරන ලදී**

**ගරු මන්ත්‍රි සමන් විතානගේ මහතා ඉදිරිපත් කරන යෝජනා**

I. ජන උදානගම මැද පාර මැණික් කඩේ අසල සිට මාර්ගය සංවර්ධනය කිරිම

**ඉහත සඳහන් යෝජනා ගරු මන්ත්‍රි ධමර්සිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**9. කාරක සභා වාර්තා**

**9.1. මුදල් ගෙවීම් වාර්තාව සම්මත කිරීම**

**සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත් ඉදිරි ගෙවීම්**

**<u>2018.08.17 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කල යුතු ආවරණ අනුමැතිය යටතේ කල ගෙවීම් පිළිබඳ වාර්තාව.</u>**

01. ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව

- ගාල්ල නගර ශාලාවේ පැවැත්වෙන දක්ෂිණ අන්තර්ජාතික පොත් ප්‍රදර්ශනය මගින් පුස්තකාල 03 සඳහා පොත් ලබා ගැනීම වෙනුවෙන් මුදල ගෙවීම - රු. 190000.00

- නාගොඩ ප්‍රාදේශීය සභාවේ පුස්තකාලවලට දක්ෂිණ අන්තර්ජාතික පොත් ප්‍රදර්ශනය මගින් පොත් ලබා ගැනීම සඳහා දකුණු පළාත් සභා මන්ත්‍රී සිසිර කුමාරරත්න මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ ලැබුනු මුදල ගෙවීම - රු.25000.00

- නාගොඩ ප්‍රාදේශීය සභාවේ පුස්තකාලවලට දක්ෂිණ අන්තර්ජාතික පොත් ප්‍රදර්ශනය මගින් පොත් ලබා ගැනීම සඳහා දකුණු පළාත් සභා මන්ත්‍රී ඉසුරු දොඩංගොඩ මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ ලැබුනු මුදල ගෙවීම - රු.10000.00

- සුළු අක්මුදල් ප්‍රතිපූර්ණය කිරීම - රු. 2996.00

- ඇප්තොප්වත්ත පොල් ඉඩමේ 2018.07.11 හා 2018.07.12 දිනවල පොල් ගස් 76 ක පොල් කැඩීම වෙනුවෙන් ගාස්තු ගෙවීම - රු. 7600.00

- ඇප්තොප්වත්ත පොල් ඉඩමේ 2018.07.20 දින පොල් ගස් 10 ක පොල් කැඩීම වෙනුවෙන් ගාස්තු ගෙවීම - රු. 1000.00

- උඩුගම ඇප්තොප්වත්ත ඉඩමේ එළදාව භුක්ති විඳීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවන ලද මුදල ප්‍රතිපූර්ණය කිරීම - රු.60600.00

02. ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, නාගොඩ

- 2018.05.08 දින පැවති මාසික සභා රැස්වීමේ සංග්‍රහ වියදම් බිල්පත පියවීම - රු. 2097.00
- 2018.06.12 දින පැවති මාසික සභා රැස්වීමේ සංග්‍රහ වියදම් බිල්පත පියවීම - රු. 2285.00

03. ආර්. ඒ. රංජිත් මානෙල්, සීගිරි හොටෙල්, නාගොඩ

- 2018.05.08 දින පැවති මාසික සභා රැස්වීමේ සංග්‍රහ වියදම් බිල්පත පියවීම - රු. 2150.00
- 2018.06.12 දින පැවති මාසික සභා රැස්වීමේ සංග්‍රහ වියදම් බිල්පත පියවීම - රු. 2735.00

04. ඩබ්. එච්. ප්‍රේමනාත් මධුසංක, මධුසංක වෙන්සෝ සර්විස් සෙන්ටර්

තණකොළ කපන යන්ත්‍ර 03 අලුත්වැඩියා කිරීම සඳහා වැය වූ මුදල පියවීම (සේවා කිරීමේ ගාස්තුව) - රු. 4760.00

**ගරු උප සභාපතිතුමා ආවරණ අනුමැතිය යටතේ කරනු ලබන ගෙවීම් වාතර්ාව සභාවට යෝජනා කළ අතර ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය එම යෝජනාව ස්ථිර කරන ලදී.**

9.2. මුදල් කමිටු වාර්තාව සම්මත කිරීම

**2018.08.17 දින පවත්වනු ලබන මහසභා රැස්වීම් සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.**

**ඉදිරි ගෙවීම්**

**01. මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම**

- **2018 මැයි මස විදුලි බිල්පත්**

| | | | |
|---|---|---|---|
| I. | 4509082908 | - උක්ඕවිට පෙර පාසල | - රු. 843.90 |

- **2018 ජූනි මස විදුලි බිල්පත්**

| | | | |
|---|---|---|---|
| I. | 2813189405 | - තල්ගස්වල පෙර පාසල | - රු 276.60 |
| II. | 4599064300 | - ගෝණදෙනිය පෙර පාසල | - රු. 294.90 |

- **2018 ජූලි මස විදුලි බිල්පත්**

| | | | |
|---|---|---|---|
| I. | 2813038709 | - කැකුලු පෙර පාසල | - රු 240.00 |
| II. | 2810125104 | - දීප්ති පෙර පාසල | - රු 331.50 |
| III. | 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු 4467.30 |
| IV. | 4509082908 | - උක්ඕවිට පෙර පාසල | - රු. 660.90 |
| V. | 2809093105 | - කොමපෝස්ට් ව්‍යාපෘතිය | - රු 1374.60 |
| VI. | 8617046104 | - බහුකාර්ය මධ්‍යස්ථානය | - රු 1063.50 |
| VII. | 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 862.20 |
| VIII. | 2813189405 | - තල්ගස්වල පෙර පාසල | - රු 276.60 |
| IX. | 4599064300 | - ගෝණදෙනිය පෙර පාසල | - රු. 240.00 |
| X. | 8616374000 | - ටොයිලට් කම්ප්ලෙක්ස් උඩුගම | - රු. 240.00 |
| XI. | 8616373802 | - උඩුගම පොළ | - රු. 240.00 |

- **ගිණුම් අංක 2809093105 දරණ කොම්පෝස්ට් ව්‍යාපෘතියේ හිග විදුලි බිල්පත් ගෙවීම**

| | | |
|---|---|---|
| 2017 මැයි | - 240.00 | |
| 2017 ජූනි | - 1045.20 | |
| 2017 අගෝස්තු | - 862.20 | |
| 2017 සැප්තැම්බර් | - 240.00 | |
| 2017 දෙසැම්බර් | - 1447.80 | - රු.3835.20 |

- **ගිණුම් අංක 4599064300 දරණ ගෝණදෙනිය පෙර පාසලේ හිග විදුලි බිල්පත් ගෙවීම**

| | | |
|---|---|---|
| 2017 මැයි | - 240.00 | |
| 2017 සැප්තැම්බර් | - 240.00 | |
| 2017 දෙසැම්බර් | - 294.90 | - රු. 774.90 |

**02. ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**

**ජූනි මස දුරකථන බිල්පත් ගෙවීම්**

| | | |
|---|---|---|
| I. | 0912296433- ප්‍රධාන කාර්යාලය | - රු 8370.93 |
| II. | 0912296537- ප්‍රධාන කාර්යාලය | - රු 4555.44 |
| III. | 0912296577- මාපලගම උප කාර්යාලය | - රු 516.38 |
| IV. | සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත ගෙවීම (0912231201) | |

- 2018.05.01 - 2018.05.31 - රු. 1511.42
- 2018.06.01 - 2018.06.30 - රු. 1470.71 - රු. 2982.13

**ජූලි මස දුරකථන බිල්පත් ගෙවීම්**

V. 0912296433- ප්‍රධාන කාර්යාලය - රු 9376.21

VI. 0912296537- ප්‍රධාන කාර්යාලය - රු 4633.27

VII. 0912296577- මාපලගම උප කාර්යාලය - රු 516.38

**03. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය**

i. ජල බිල්පත් ගෙවීම- උඩුගම උප කාර්යාලය-33/53/003/008/11
(2018.05.18-2018.06.18) - රු. 2766.90

ii. ජල බිල්පත් ගෙවීම- උඩුගම උප කාර්යාලය-33/53/003/008/11
(2018.06.18-2018.07.18) - රු. 3967.50

iii. ජල බිල්පත් ගෙවීම- උඩුගම උප කාර්යාලය-33/53/003/008/11
පුරනැගුම ගොඩනැගිල්ල ඉදිකිරීමේ සිට (2015 පෙබරවාරි සිට)නොගෙවූ මාසවල හිග මුදල් එකතුව
- රු. 55052.73

**04. මොබිටෙල් පුද්ගලික සමාගම**

පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කෙටි පණිවුඩ සේවා ගාස්තු ගෙවීම
(2018.06.25) - රු. 74.84

**05. සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමුපකාර සමිතිය**

**2018 ජූනි මස ඉන්ධන ලබා ගැනීමේ බිල්පත්**

| | | |
|---|---|---|
| PF 7360 කැබ් රථය | ඩීසල් ලීටර් 565 ක | - රු.61585.00 |
| LL 7103 ටිපර් රථය | ඩීසල් ලීටර් 70 ක | - රු. 7630.00 |
| LL 7650 කෲ කැබ් | ඩීසල් ලීටර් 105 ක | - රු. 11445.00 |
| RD 1637 ට්‍රැක්ටරය | ඩීසල් ලීටර් 124 ක | - රු. 13516.00 |
| 252-6478 කැබ් රථය | ඩීසල් ලීටර් 278 ක | - රු 30302.00 |
| RD 9457 ට්‍රැක්ටරය | ඩීසල් ලීටර් 15 ක | - රු. 1635.00 |

**2018 ජූලි මස ඉන්ධන ලබා ගැනීමේ බිල්පත්**

| | | |
|---|---|---|
| PF 7360 කැබ් රථය | ඩීසල් ලීටර් 591 ක | - රු.68253.00 |
| LL 7103 ටිපර් රථය | ඩීසල් ලීටර් 152 ක | - රු. 17468.00 |
| LL 7650 කෲ කැබ් | ඩීසල් ලීටර් 80 ක | - රු. 8720.00 |
| RD 1637 ට්‍රැක්ටරය | ඩීසල් ලීටර් 84 ක | - රු. 9534.00 |
| 252-6478 කැබ් රථය | ඩීසල් ලීටර් 338 ක | - රු 38939.00 |
| LL 7366 ට්‍රක් බවුසරය | ඩීසල් ලීටර් 50 ක | - රු. 5900.00 |
| ජලභීතිකා වැඩසටහනට යොදා ගන්නා වාහනය සඳහා | පෙට්‍රල් ලීටර් 5 ක | - රු. 725.00 |
| ගබඩාවට | ඩීසල් ලීටර් 50 (හාඩ්මෙක් රථය සඳහා) | - රු. 5900.00 |
| | පෙට්‍රල් ලීටර් 20 (තණකොළ කපන යන්ත්‍රයට) | - රු. 2900.00 |

**06. ලේකම් , නාගොඩ ප්‍රාදේශීය සභාව**

I. මාපලගම පැරණි කඩ කාමර අංක 1 සඳහා ගෙවීමට ඇති හිග විදුලි
බිල්පතෙහි මුදල් ප්‍රතිපූර්ණය කිරීම - රු. 1000.00

II. මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ට ආහාර සාම්පල් ලබා ගැනීම සඳහා අත්
මුදල් ලබා දීම (යූ. කේ. ජයන්ත මයා, ම.සෞ.ප) - රු. 1000.00

III. මාපලගම පැරණි කඩ කාමර අංක 01 හි විදුලි බිල්පතෙහි පවතින නම, "සභාපති , නාගොඩ ප්‍රාදේශීය සභාව" ලෙස සංශෝධනය කිරීමේ ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම - රු. 1500.00

IV. PF 7360 දරණ කැබ් රථය අධිවේගී මාර්ගයේ යාමට හා ඒමට ගිය වියදම් ප්‍රතිපූර්ණය

- 2018.07.04 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව -රු. 700.00
- 2018.08.07 පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය -රු. 850.00
- 2018.08.08 විදුලි උපකරණ හා අනෙකුත් උපාංග ලබා ගැනීම සඳහා - රු. 750.00

**07. ගමන් වියදම් ගෙවීම්**

**2018 මැයි**

| | | | |
|---|---|---|---|
| I. | යූ.වී.මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 299.00 |

**2018 ජූනි**

| | | | |
|---|---|---|---|
| II. | එච්. එම්. හේවාවිතාන මෙය | - කළමනාකරණ සහකාර | - රු. 524.00 |
| III. | ඩී. එන්. ඩී. පලිහවඩන මිය | - ආදායම් පරීක්ෂක | - රු. 285.00 |
| IV. | යූ.වී.මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 649.00 |
| V. | ටෙක්ලා මනෝජනි මිය | - පෙර පාසල් ගුරු | - රු. 524.00 |
| VI. | කේ. එච්. එම්. රසිකා ප්‍රියදර්ශනී මිය | - පෙර පාසල් ගුරු | - රු. 524.00 |
| VII. | දම්මි ගීතානි විජේසේකර මිය | - පෙර පාසල් ගුරු | - රු. 524.00 |
| VIII. | අයි.කේ.ඉන්දික කුමාර සම්පත් මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1572.00 |
| IX. | එම්. එම්. මහින්දදාස මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1572.00 |
| X. | කේ.පී.පී.ප්‍රසන්න මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1572.00 |

**2018 ජූලි**

| | | | |
|---|---|---|---|
| I. | දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 430.00 |
| II. | එම්. ඒ. ඩිලානි චන්ද්‍රප්‍රභා මෙය | - ප්‍රධාන කළමනාකරණ සහකාර | - රු. 524.00 |
| III. | එස්. කේ. මල්ලවආරච්චි මයා | - කළමනාකරණ සහකාර | - රු. 926.00 |
| IV. | පී. පී. පී. ශ්‍රීනිකා මෙය | - කළමනාකරණ සහකාර | - රු. 1048.00 |
| V. | එච්. එම්. හේවාවිතාන මෙය | - කළමනාකරණ සහකාර | - රු. 1048.00 |
| VI. | බී. ඩී. එල්. ඩී. කුමාරි මිය | - පුස්තකාලයාධිපති | - රු. 518.00 |
| VII. | ශ්‍රියානි කිරින්දගේ මිය | - පුස්තකාලයාධිපත | - රු. 350.00 |
| VIII. | එන්. පී. ගීතා රංජනී මිය | - පුස්තකාල සහායක | - රු. 1572.00 |
| IX. | ඩබ්.ආර්.අනුෂි වසන්තිකා මිය | - පුස්තකාල සහායක | - රු. 350.00 |
| X. | ධනංජනී ඩයස් පතිනායක මිය | - පුස්තකාල සහායක | - රු. 524.00 |
| XI. | වයි. පී. ගංගා පද්මිනී මෙය | - පුස්තකාල සහායක | - රු. 524.00 |
| XII. | කේ. පී. ජයනි මිය | - සංවර්ධන නිලධාරී | - රු. 1572.00 |
| XIII. | කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 1044.00 |
| XIV. | පී. බී. කේ. පේමලතා මිය | - පෙර පාසල් ගුරු | - රු. 518.00 |
| XV. | එම්. ඒ. වසන්ත මයා | - රියදුරු | - රු. 2275.00 |
| XVI. | බී. පී. පියතිලක මයා | - රියදුරු | - රු. 1050.00 |
| XVII. | ඩබ්.ඒ.චමරි මදුෂානි මිය | - කාර්යාල කාර්ය සහායක | - රු. 1048.00 |

| | | | |
|---|---|---|---|
| XVIII. | යූ.වී.මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 524.00 |
| XIX. | කේ.පී.පී.ප්‍රසන්න මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1572.00 |
| XX. | අයි.කේ.ඉන්දික කුමාර සම්පත් මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1572.00 |
| XXI. | එම්. එම්. මහින්දදාස මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1572.00 |
| XXII. | යූ. පී. උපනාම | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1572.00 |
| XXIII. | එච්. ඩබ්. එස්. මල්කාන්ති මිය | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1572.00 |

**2018 අගෝස්තු**

| | | | |
|---|---|---|---|
| I. | ඩබ්.ඒ.ශාන්ත මයා | - සංවර්ධන නිලධාරී | -රු. 574.00 |
| II. | බී. ඩී. රුවිනි චතුරිකා මෙය | - කළමනාකරණ සහකාර | - රු. 1048.00 |
| III. | එස්. කේ. මල්ලවආරච්චි මයා | - කළමනාකරණ සහකාර | - රු. 877.00 |

**08. පරිවර්ථිත ගමන් වියදම් (ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා) 2018 මැයි**

| | | | |
|---|---|---|---|
| I. | ඩී. ටී. සිරිවර්ධන මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 4000.00 |

**පරිවර්ථිත ගමන් වියදම් (ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා) 2018 ජූනි**

| | | | |
|---|---|---|---|
| I. | ඩී. එන්. ඩී. පලිහවඩන මිය | - ආදායම් පරීක්ෂක | - රු. 2730.00 |
| II. | අයි. චතුරි චින්තිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 2995.00 |

**පරිවර්ථිත ගමන් වියදම් (ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා) 2018 ජූලි**

| | | | |
|---|---|---|---|
| I. | ඩබ්.ජේ.ඒ.ශානක මයා | - ආදායම් පරීක්ෂක | - රු. 3000.00 |
| II. | කේ. පී. ජයනි මිය | - සංවර්ධන නිලධාරී | - රු. 3000.00 |
| III. | අයි. චතුරි චින්තිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 3000.00 |
| IV. | දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 4000.00 |
| V. | කේ. ඒ. එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 4000.00 |

**09. අතිකාල දීමනා ගෙවීම්**

**2018 මැයි**

| | | | |
|---|---|---|---|
| I. | යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු. 3646.50 |

**2018 ජූනි**

| | | | |
|---|---|---|---|
| I. | ඩී. ටී. ආර්. ඒ ගුණරත්න මයා | - මුරකරු | - රු. 4793.70 |
| II. | යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු. 8580.00 |

**2018 ජූලි**

| | | | |
|---|---|---|---|
| I. | යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු. 5148.00 |
| II. | ඩී. ටී. ආර්. ඒ ගුණරත්න මයා | - මුරකරු | - රු. 6198.75 |
| III. | ඒ. එච්. පී. සංජීව මයා (මුර සේවය වෙනුවෙන්) | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 4200.00 |
| IV. | එම්. ඒ. වසන්ත මයා | - රියදුරු | - රු. 7034.00 |
| V. | බී. පී. පියතිලක මයා | - රියදුරු | - රු. 7034.40 |

**10. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව**

විගණකාධිපති දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු හිග විගණන ගාස්තු
මුදලින් කොටසක් ගෙවීම - රු.10000.00

**11. ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව, ගාල්ල**
මාපලගම ආයුර්වේද බෙහෙත් ශාලාව වෙත ලබා ගත් ඖෂධ සඳහා මුදල් ගෙවීම - රු. 12265.00

**12. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, කොළඹ 10**

**I. නිදහස් දුම්රිය බලපත්‍ර ගාස්තු ගෙවීම**

එම්. එම්. මහින්දදාස මයා - රු.5550.00
යු. පී. රංජිත් උදය කුමාර මයා - රු. 1360.00
බී. පී. පියතිලක මයා - රු. 1760.00
කේ. කේ. අවන්ත පද්ම - රු. 1760.00

II. 2017.12.31 දිනට දුම්රිය බිල්පත් සඳහා ගෙවීමට ඇති හිග දුම්රිය
බිල්පත්ගෙවීම. - රු.19175.00

**13. දයානි පුද් සමාගම, මාපලගම**

I. තණකොළ කපන යන්ත්‍ර 03ක් අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිලදී
ගැනීමේ බිල්පත පියවීම (2018.07.20) -රු. 2500.00

II. වාහන සොදන යන්ත්‍රය සඳහා අවශ්‍ය උපාංග ලබා ගැනීමේ බිල්පත පියවීම - රු. 550.00

**14. මුතුහෙට්ටිගම ඉලෙක්ට්‍රිකල්ස්, උඩුගම**
තණකොළ කපන යන්ත්‍ර 03ක් අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය අමතර කොටස්
ලබා ගැනීමේ බිල්පත පියවීම. (2018.07.25)

මැෂින් 01 සඳහා- 1700.00
මැෂින් 02 සඳහා- 2102.00
මැෂින් 03 සඳහා- 3627.00 - රු. 7429.00

**15. එච්. එල් කේ ශ්‍රීනිත් රුක්ෂාන් උඩුගම**

උඩුගම මහජන පුස්තකාලයට පුවත් පත් සැපයීම වෙනුවෙන් ගෙවීම
2018 ජූලි රු 4675.00

**16. ඒ. ඩී. කරුණාරත්න, යටලමත්ත**
නාගොඩ මහජන පුස්තකාලයට පුවත් පත් සැපයීම වෙනුවෙන් ගෙවීම
2018 මැයි - රු 5120.00
2018 ජුනි - රු 5020.00
2018 ජූලි - රු.5495.00

**17. යු.කේ.ජයන්ත මයා , ම.සෞ.ප.**

i. ආහාර පනතේ නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම හා ඒම
වෙනුවෙන් ගෙවීම් (2018.08.10) - රු. 350.00

**18. නීතිඥ හේමන්ත පී. ඩබ්. විතාරණ මයා, කොටුව, ගාල්ල**

I. නඩු අංක L 16242 දරණ නඩුව වෙනුවෙන 2017.07.20 දින පෙනී සිටීමේ
ගාස්තු ගෙවීම - රු. 3000.00

**19. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කොළඹ 02**

I. හිග එකතු කල අගය මත බදු මුදල කොටස් වශයෙන් ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේශණය කිරීම - රු.12000.00

II. 2018.04.01 - 2018.06.30 දක්වා කාර්තුවට අය කර ගත් මුද්දර බදු මුදල් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේශණය කිරීම - රු. 4650.00

**20. පී. පී. සදුන් චතුරංග, මාපලගම**

- Canon වර්ගයේ ලේසර් ජෙට් ප්‍රින්ටරයක් මිළදී ගැනීමේ බිල්පත (සංවර්ධන අංශය) - රු. 14500.00
- නාප්‍රාස/ආ/04/07 පරිගණකය සඳහා Canon image class 6030 වර්ගයේ ප්‍රින්ටරයක් මිළදී ගැනීමේ බිල්පත පියවීම.(ආයතන අංශය) - රු. 14500.00
- 78 A ලේසර් ජෙට් ටෝනර් කාට්ලේජයක් ලබා ගැනීමේ බිල්පත පියවීම - රු. 10250.00
- නාප්‍රාස/ආ/04/05 පරිගණකය සඳහා USB optical mouse එකක් මිලදී ගැනීමේ බිල්පත පියවීම. - රු. 850.00

**21. සදර්න් ඩිජිටල් ප්‍රින්ටන් ඇන්ඩ් ඇඩ්වර්ටයිසින්, ගාල්ල**

මහජන පුස්තකාල පාඨක සමාජ විසින් පවත්වනු ලබන ප්‍රජා සත්කාරක සේවාවන් වෙනුවෙන් ප්‍රදර්ශනය කිරීම සඳහා නිර්මාණය කරන ලද අගල් 7 X 4 බැනරය මුද්‍රණය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු, 2100.00

**22 පෝස්ට් මාස්ටර් ජනරාල් ගි.අං.0131001990273346ට බැර**

2018.08.06 දිනට ගෙවිය යුතු තැපැල් ගාස්තු ගෙවීම - රු. 19694.00

**23. උපාලි නිව්ස් පේපර්ස්, කොළඹ 13**

භාවිතයෙන් ඉවත් කරන ලද වාහන ප්‍රසිද්ධ වෙන්දේසියේ වෙන්දේසි කිරීම පිලිබඳ දැන්වීම් පළකිරීම වෙනුවෙන් ගෙවීම - රු. 9660.00

**24. සිංහගිරි ග්‍රොසරි, උඩුගම**

කසළ කළමනාකරණයෙහි යෙදෙන සේවකයින් සදහා සබන් ලබා ගැනීමේ බිල්පත පියවීම - රු. 2600.00

**25. එච්. වී. අමරසිරි, තල්ගස්වල**

2018.01.13 දින උඩුගම මහජන ක්‍රීඩාංගනයේ පැවති උත්සවය වෙනුවෙන් උඩුගම පොළ භූමියෙන් විදුලිය ලබා ගැනීම නිසා ඒ සඳහා පොළ බදු කරුට ගෙවිය යුතු විදුලි බිල්පත් මුදල ආපසු ගෙවීම - රු. 1410.00

**26. ගෝල් අයි. ටී. සොලියුෂන්, ගාල්ල**

නව ඇගිලි සළකුණු යන්ත්‍රයක් මිළදී ගැනීමේ බිල්පත - රු.24900.00

**27. පැරගන් ස්ටේෂනරස්, ගාල්ල**

i. ප්‍රධාන කාර්යාලය සඳහා ලිපිද්‍රව්‍ය මිළදී ගැනීම වෙනුවෙන් බිල්පත පියවීම (2018.07.11) - රු. 27309.25

ii. ප්‍රධාන කාර්යාලය සඳහා ලිපිද්‍රව්‍ය මිළදී ගැනීම වෙනුවෙන් බිල්පත පියවීම (2018.08.10) -රු. 5718.00

**28. සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව**

i. තණකොළ කපන මැෂින් එකක් ලබා ගැනීම වෙනුවෙන් බිල්පත පියවීම - රු. 16300.00
ii. සභාව සතු වාහන සේදීමට හයි ප්‍රෙෂර් පම්ප් මිළදී ගැනීම වෙනුවෙන් බිල්පත පියවීම - රු. 23575.00

**29. එම්. පී. කල්ප ප්‍රසාද්, සිංහගිරි ෆර්නිචර්ස්, උඩුගම**

කාර්යාලයට අවශ්‍ය කාර්යාලීය අල්මාරිය, ලියන මේස, පරිගණක පුටු මිළදී ගැනීම වෙනුවෙන් බිල්පත පියවීම - රු.103100.00

**30. ටී. පී. ජෝතිපාල මයා, උඩුගම**
2018.07.14 දින උඩුගම බහුකාර්ය ගොඩනැගිල්ල වෙන් කිරීමට අදාල තැන්පතු මුදල් ආපසු ගෙවීම - රු. 5000.00

**31. ටී. පී. සුමනසිරි මයා, ටී. පී. හාඩ්වයාර්, නාගොඩ**
නාගොඩ ප්‍රාදේශීය සභාවේ ගෑස් සිලින්ඩරය පිරවීමේ බිල්පත පියවීම - රු. 690.00

**32. ඩබ්. ඒ. චමිල් මධුෂංක වීරසිංහ, වලහන්දූව**
2015 වර්ෂය සඳහා උඩුගම සදුදා සතිපොළෙහි පොළ පවිත්‍ර කිරීමේ ගාස්තු ආපසු ගෙවීම් - රු. 7500.00

**33. පී.එල්.රංජන්, ඇල්බට් චිත්‍ර ශිල්පියෝ,ගාල්ල**
ගොඩනැගිලි අනුමත කිරීම සඳහා නිල මුද්‍රාවක් ලබා ගැනීම වෙනුවෙන් බිල්පත පියවීම. - රු. 500.00

**34. ආර්.ඒ.රංජිත් මානෙල් ,සීගිරි හොටෙල් ,නාගොඩ**
2018.07.10 දින පැවති මාසික සභා රැස්වීමේ සංග්‍රහ වියදම් බිල්පත පියවීම (ආහාර ලබා ගැනීම) -රු. 2815.00

**35. ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්,නාගොඩ.**
i. 2018.07.10 දින පැවති මාසික සභා රැස්වීමේ සංග්‍රහ වියදම් බිල්පත පියවීම (තේ සංග්‍රහයට අවශ්‍ය ද්‍රව්‍ය) -රු. 2435.00
ii. කටුපොල් වගාකිරීම සම්බන්ධව පැවති සාකච්ඡාව සඳහා සහභාගි වූ පිරිසට සංග්‍රහ කිරීමේ වියදම් බිල්පත පියවීම -රු. 1470.00

**36. ෆෝට් ඩ්‍රයිව්, ගාල්ල**
PF 7360 දරණ කැබ් රථය සඳහා ස්ටීරියන් කවර්, වොෂිං ක්ලොත්, රබර් ලේන්සු, එයාර් ෆ්‍රෙෂ්නර් මිළදී ගැනීමේ බිල්පත පියවීම (2018.08.10) -රු. 3350.00

**37. ඉන්ද්‍රා ට්‍රේඩර්ස් ප්‍රයිවට් ලිමිටඩ්, මාතර**
LL 7650 දරණ කෘෂ කැබ් රථයේ අළුත්වැඩියා කිරීමේ බිල්පත පියවීම -රු.110540.00

**38. යුනයිටඩ් මෝටර්ස්, මාතර**
PF 7360 දරණ කැබ් රථයේ වයිපර් බ්ලේඩ් සවි කිරීමේ බිල්පත පියවීම -රු. 6237.20

**39. එම්. ඒ. ආරියවංශ මයා, නාගොඩ**

i. SC 3570 හාඩ්මෙක් රථයේ හයිඩ්‍රොලික් පොම්පය අලුත්වැඩියා කිරීමේ බිල්පත (2018.07.11) -රු. 500.00

ii. SC 3570 හාඩ්මෙක් රථයේ ක්ලච් එක සකස් කිරීම සහ ඉන්ජෙක්ටර් පොම්පයේ ඇජෙස්ට්මන්ට් එකේ ඕල් රින් එක දැමීමේ බිල්පත(2018.07.24) -රු. 1050.00

**40. ආසිරි ටයර් ට්‍රේඩර්ස් ඇන්ඩ් ඔටෝ සර්විස්, ඇතුමලේ**

SC 3570 හාඩ්මෙක් රථයට හයිඩ්‍රොලික් ඔයිල් ලබා ගැනීමේ බිල්පත පියවීම (2018.07.11) - රු. 7600.00

**41.එස්.එච්.එස්.රිහානා, ගාල්ල**

නව තනතුරු සඳහා සේවකයන් බඳවා ගැනීමේ ගැසට් නිවේදනය දෙමළ භාෂාවට පරිවර්ථනය කිරීමේ ගාස්තු ගෙවීම. - රු. 3189.00

**42. ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පී එල් සී.කොළඹ 02**

MP2001L ඡායා පිටපත් යන්ත්‍රය සඳහා ටෝනර් කාට්ලේජ් 02 ක් ලබා ගැනීමේ බිල්පත පියවීම - රු. 14790.00

**43. ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී කණ්ඩායමට 2018 අගෝස්තු මස සඳහා ඉන්ධන වෙනුවෙන් දීමනා ගෙවීම - රු. 81000.00

ii. ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී කණ්ඩායමට 2018 අගෝස්තු මස සඳහා පෙරගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත - රු. 28500.00

**44. ජයන්ත ඉලේපෙරුමආරච්චි, නාගොඩ**

2018 වර්ෂයේ ජූලි මස සභා වාරයේ සභා වාර්තාව පිටපත් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම -රු. 3562.50

**45. චානක ප්‍රියංග මයා, නාගොඩ**

2018 වර්ෂයේ ප්‍රථම සභා වාරයේ නිල උත්සවය ඡායාරූපගත කිරීම හා ඇල්බමයක් සෑදීම සඳහා ගෙවීම - රු.12000.00

**<u>පොදු අරමුදල් කර්මාන්ත</u>**

**46. කුරුපනාව ගොවි සංවිධානයේ මහජන බැංකුවේ ගි.අං.272200150005456 ට බැර**

උඩුගම උප කාර්යාලයේ වාහන අංගනය සකස් කිරීමේ කර්මාන්තයේ 10% ක රැඳවුම් මුදල් නිදහස් කිරීම. - රු. 89299.01

**47. එක්සත් සුළු ගොවි සංවිධානය, මාපලගම**

නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ ප්‍රවේශ මාර්ගය ප්‍රතිසංස්කරණය

කිරීමේ කර්මාන්තයේ 10% ක රැඳවුම් මුදල් ආපසු ගෙවීම. - රු. 20254.98

**රජයේ ආධාර**

**48.. ලේකම් දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය , දක්ෂිණාපාය, ලබුදූව**

I. කුරුන්ද දාවුල්හේන මාර්ගයට ජලය සැපයීම සඳහා මාර්ගය පළුදු කිරීම හේතුවෙන් ලැබුණු මුදල ව්‍යාපෘතිය ඉටු නොවීම නිසා නැවත අමාත්‍යංශය වෙත ගෙවීම - රු.171413.67

II. බංගම පාරෙන් අතුරු පස් පාරවල අයින සකස් කිරීම හා කොතලාවල පාර, කොන්ක්‍රීට් පාර හරහා සකස් කිරීමේදී මාර්ගය පළුදු වීම හේතුවෙන් ලැබුණු මුදල් ව්‍යාපෘති ඉටු නොවීම නිසා නැවත ගෙවීම. - රු. 278176.77

**49. ගොවිසෙත ගොවි සංවිධානය, පරණතානායම්ගොඩ**

පරණතානායම්ගොඩ පිඹුරුදෙණිය මාර්ගය කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ අවසාන ගෙවීම සිදු කිරීම. -රු. 90784.39

**50. උඩුගම නැගෙනහිර ගොවි සංවිධානය, උඩුගම.**

උඩුගම දකුණ පොදු නාන ළිං දෙකක් සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ 10% රැදවුම් මුදල් නිදහස් කිරීම -රු. 70890.46

**51. එම්. වී.නාමල් ලක්රුවන් , ගෝණදෙණිය ,උඩුගම.(මන්ත්‍රී ප්‍රතිපාදන)**

ජන උදානගම මැදපාර (මැණික් කඩේ අසල සිට මාර්ගය) JCB යන්ත්‍රය යොදවා සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවීම. - රු.25000.00

**සේවක ණය**

**52. දසමස් වැටුප් අත්තිකාරම් ලබා ගැනීම**
වයි. පී. ගංගා පත්මිණී මෙය - රු198360.00

**මුදල් ගෙවීම් වාතර්ාව පිළිබඳ විස්තර කරමින්,**

ගරු සභාපතිතුමා විසින්, මේ ඇස්තමේන්තු,ඉදිරි ගෙවීම් වාතර්ා ලැබිල ඇති. ඒව අනුමත කරගන්න.

එහිදී ගරු මන්ත්‍රී තරංග සුදශර්න මහතා මුදල් ගෙවීම් වාතර්ාව පිළිබඳ විමසීමක් කරමින් උඩුගම පුරනැගුම ගොඩනැගිල්ලෙ රු. 55000.00 ක ජල බිලක් මේකෙ පොඩි ප්‍රශ්නයක් තියෙනවා. මෙය කොන්ත්‍රාත්කරුවන් විසින්ද ජලය පාවිච්චි කර ඇති නිසා මේ පිළිබදව පැහැදිලි කර ගෙන ගෙවීම් කටයුතු කරන්න යනුවෙන් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි මහතා මෙහිදී අංක 50 යටතේ ඇති බිල්පතක් පිළිබඳ විමසමින්, උඩුගම නැගෙනහිර ගොවි සංවිධානය කියන එකට ගෙවීම් කරන්න නියම වෙලා තියෙනවා. උඩුගම

දකුණ පොදු නාන ළිං දෙකක් සංවධර්නය කිරීම වෙනුවෙන් කියලා. අපි ඒව තියෙන්නෙ කොහෙද කියලා දැනුවත් නැහැ. ඒක නිසා ඒ පිළිබඳ දැනුවත් වෙන්න ක්‍රමයක් නැද්ද? දින වකවානු දැන ගන්න ක්‍රමයක් නැද්ද? යනුවෙන් විමසීය.

එයට පිළිතුරු දුන් ගරු සභාපතිතුමා 2017 08.22 අනුමත වෙලා තියෙන්නෙ. පළාත් නිශ්චිත සංවධර්න ප්‍රදාන ප්‍රජා ජල ව්‍යාපෘති නව වැඩ අනුමත මුදල ලක්ෂ නවයයි. 2017 කරලා තියෙන්නේ. ඒ සම්බන්ධව දැනගන්න පුලුවන් ෆයිල් එක තියෙනවා.

මුදල් ගෙවීම් වාතර්ාව සම්බන්ධව ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා විමසීමක් කරමින් මෙහි 49 ය බිල්පත යටතේ මාගර්යක් කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් ගෙවීමක් තියෙනවා ඒ පිළිබඳ දැන ගන්න අවශ්‍ය බව පවසීය.

එයට පිළිතුරු දෙමින් ගරු සභාපතිතුමා කියා සිටියේ ඕක මැතක එකක් නෙවෙයි. දොරින් දොරට ගමින් ගමට වැඩසටහන යටතේ 2014 වෂර්යේ කරපු එකක්. මෙහි මුදල් ඇවිල්ල තියෙන්නේ කොටස් වශයෙන් ඒ එක කොටසක් තමයි දැන් ගෙවන්නේ. අවසාන ගෙවීම. තමයි ගෙවන්නෙ යනුවෙන් ඒ පිළිබඳ පැහැදිලි කරන ලදී.

**ගරු උප සභාපතිතුමා ආවරණ අනුමැතිය යටතේ කරනු ලබන ගෙවීම් වාතර්ාව සභාවට යෝජනා කළ අතර ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය එම යෝජනාව ස්ථිර කරන ලදී.**

**9.3 ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

| ඇස්තමේන්තුව | මුදල රු. |
|---|---|
| **පොදු අරමුදල් ඇස්තමේන්තු** | |
| **මිනුවන්ගොඩකන්ද සවෙර්ාදය මාවත සංවධර්නය කිරීම** | **83000.00** |
| **සංවධර්න ගම්මානය කන්ද පාර සංවධර්නය කිරීම** | **100000.00** |
| **ජනඋදානගම මැද පාර මැනික්කඩේ අසල සිට මාගර්ය සංවධර්නය කිරීම** | **20000.00** |
| **බණ්ඩාරනායකපුර බන්ඩිහේන මාගර්ය සංවධර්නය කිරීම** | **20000.00** |
| **උඩලමත්ත කන්දඋඩදෙනිය මාගර්ය කොන්ක්‍රීට් දමා පිළිසකර කිරීම** | **61000.00** |
| **මන්ත්‍රී ප්‍රතිපාදන ඇස්තමේන්තු** | |
| **හෝමදොල නො 65 මාගර්ය කෙටලපද්දල මාගර්යේ මහ වංගුවේ සිට කොන්ක්‍රීට් පාර දක්වා සංවධර්නය කිරීම** | **22500.00** |
| **ගෝණදෙනිය යහලදූවවත්ත පාර තාර අවසන් වූ තැන සිට වසන්ත මහතාගේ නිවස අසළ මංසන්ධිය දක්වා සංවධර්නය කිරීම** | **22500.00** |

**ගෝණදෙනිය දොලඉහලකන්ද ප්‍රසාද් මහතාගේ නිවස අසල සිට උපුල් මහතාගේ නිවස දක්වා කාණු කපා මට්ටම් කිරීම 22500.00**

**ගෝණදෙනිය දොළ ඉහළ කන්ද පාසල්ගොඩකන්ද යා කරන මාගර්ය කාණු කපා මට්ටම් කිරීම 15000.00**

**දිසානායක මාවත අතුරු මාගර්ය තුන්මං හන්දියේ සිට සිරිල් මහතාගේ නිවස දෙසට කාණු කපා මට්ටම් කිරීම 17250.00**

**පළාත් නිශ්චිත සංවධර්න ප්‍රධාන ඇස්තමේන්තු**

**උඩුගම පුස්තකාලයේ ජල සැපයුම් හා සනීපාරක්ෂක වැසිකිළි පද්ධති ස්ථාපනය කිරීම 1300000.00**

**ඉහත ඇස්තමේන්තු සඳහා සභාවේ එකගතාවය පළ කල අතර ඒකමතිකව සභා සම්මත විය.**

**9.4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**01. වායු සමන යන්ත්‍ර සවි කිරීම සඳහා ලැබී ඇති මිළ ගණන්**

| විස්තරය | කූල් ටෙක් , ඉන්ජිනියරින්, | දම්රෝ ආයතනය ගාල්ල | සිංගර් ආයතනය ගාල්ල | සුපර්කූල් ආයතනය |
|---|---|---|---|---|
| වායු සමන යන්ත්‍ර සවි කිරීම | රු. 294,000.00 | රු. 94410.00 | රු. 116990.00 | රු. 264000.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවෙ ටෙන්ඩර් කමිටු වාතර්ාව ඔබතුමන්ල ලඟ ඇති. ඔබතුමාල පළවෙනි දවසෙ ඉදල ඉල්ලපු ඉල්ලීම සභා රැස්වීම් ශාලාව වායු සමනය කරන්න මිල ගණන් ගෙනැල්ල තියෙනවා. සිංගර් ආයතනය,දම්රෝ හා කූල් ටෙක් ආයතනවලින්. එයින් අඩුම දම්රෝ ආයතනයෙ මිල ගණන්. එහි වගකීම් කාලය අවුරුදු පහයි. අඩුම සහ හොදම එක තෝරගෙන වැඩ කටයුතු කරමු. අඩුම සහ හොදම මිල යටතේ සභා රැස්වීම් ශාලාව වායු සමනය කිරීම සඳහා ඒකමතිකව එකඟතාව පළ විය.

## 2018.08.14 දින නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ පැවති ටෙන්ඩර් කමිටුවේ වාර්තාවයි.

**01**.ප්‍රධාන කාර්යාලයේ භාවිතා කරන ඡායා පිටපත් යන්ත්‍රයේ වාර්ෂික සේවා ගිවිසුම අවසාන වීම නිසා ,ඉදිරි වර්ෂය සඳහා සේවා ගිවිසුම පවත්වාගෙන යාම වෙනුවෙන් කර තිබූ ඉල්ලීමට අනුව ඒ සඳහා සේවා නියෝජිත ආයතනය වන Gestetner of Ceylon PLC වෙතින් සිදු කිරීමට තීරණය කෙරිණී.

**02**.මාර්ග කම්කරුවන් සඳහා අවශ්‍ය උපකරණ වෙනුවෙන් ලැබී තිබූ ඉල්ලීමට අනුව එම උපකරණ රජයේ ආයතනයක් වන සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් ගෙන්වීමට තීරණය විය.

**03**.මුරකරුවන් සඳහා අවශ්‍ය උපකරණ වෙනුවෙන් ලැබී තිබූ ඉල්ලීමට අනුව එම උපකරණ රජයේ ආයතනයක් වන සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් ගෙන්වීමට තීරණය විය.

**04**.PF 7360 දරණ කැබ් රථයෙහි කැනපි එකේ ලොක් එක සෑදීමට කර තිබු ඉල්ලීමට අනුව ඒ සඳහා පෙර සේවා ආයතනය වන ELCARDO TRADING (PVT)LTD වෙතින් සිදු කිරීමට තීරණය විය.

**05**. PF 7360 දරණ කැබ් රථය සේවා කිරීම සඳහා ලැබී තිබු ඉල්ලීමට අනුව එහි සේවා නියෝජිත ආයතනය වන යුනයිටඩ් මෝටර්ස් මාතර ශාඛාවෙන් සිදු කිරීමට තීරණය විය.

**06**.ප්‍රාදේශීය සභා මන්ත්‍රී මණ්ඩලය සඳහා රාජකාරී හැඳුනුම්පත් සකස් කිරීම සඳහා මිල ගණන් කැඳවා තිබුණි.

| | **හැඳුනුම්පත සඳහා** | **රඳවන පටිය** | **රඳවන පටිය රහිත** | **කවරය සඳහා** |
|---|---|---|---|---|
| ලයන් ෆොටෝ ,කළුවැල්ල | 350.00 | 125.00 | 60.00 | 60.00 |
| ලක්මාලි ස්ටුඩියෝ ,වක්වැල්ල | 450.00 | 160.00 | 85.00 | 80.00 |
| ස්ටුඩියෝ ගාලු සේයා, වක්වැල්ල | 425.00 | 180.00 | - | 90.00 |

මේ සඳහා අඩුම මිල ගණන් ඉදිරිපත් කළ කළුවැල්ල ලයන් ෆොටෝ වෙතින් සිදු කිරීමට තීරණය කරන ලදී.

**07**.දිග අඩි 2 1/2 හා පළල අඩි 01 ප්‍රමාණයේ නාම පුවරුවක් සෑදීමට මිල ගණන් කැඳවා තිබුණි.

| | **නාම පුවරුව සඳහා** | **පුවරුව සවි කිරීමේ GI බටය සඳහා** |
|---|---|---|
| ඇල්බට් චිත්‍ර ශිල්පියෝ,ගාල්ල | රු:3500.00 | රු:1500.00 |
| ආරි ඇඩ්ස් ,ගාල්ල | රු:4500.00 | රු:2000.00 |
| ෂා ක්‍රියේෂන්ස්, හබරාදුව | රු:4000.00 | රු:1750.00 |

මේ සඳහා අඩුම මිල ගණන් ඉදිරිපත් කල ගාල්ල ඇල්බට් චිත්‍ර ශිල්පියෝ වෙතින් එම කාර්යය නිම කිරීමට තීරණය විය.

**08**.සාහිත්‍ය නිර්මාණ තරගාවලිය-2018 සඳහා වර්ණ 4 කින් යුත් සහතික පත මුද්‍රණය සඳහා මිල ගණන් කැඳවා තිබුණි.

| | |
|---|---|
| කෙත්සිරි කමියුනිකේෂන්, තල්ගස්වල | රු. 35.00 |
| අතුකෝරල ප්‍රින්ටර්ස්, පිටිගල | රු. 43.80 |
| චන්දිමා ප්‍රින්ටර්ස් .ඇල්පිටිය | රු. 44.50 |

මෙහිදී අඩුම මිල ගණන් ඉදිරිපත් කල කෙත්සිරි කමියුනිකේෂන්, තල්ගස්වල වෙතින් එම කාර්යය නිම කිරීමට තීරණය කරන ලදී.

**09.** වීථි පහන් කට්ටල අලුත්වැඩියාව සඳහා අවශ්‍ය උපකරණ වෙනුවෙන් මිල ගණන් ලැබී තිබු අතර ඒවා පහත පරිදි වේ

| | SKYWAY **ඉලෙක්ට්‍රිකල්ස 69,පළමු හරස් වීදිය,කොලඹ 11** | UK **ඉලෙක්ට්‍රිකල්ස් පළමු හරස් වීදිය,කොලඹ 11** | **ඇන්ටන් ඉලෙක්ට්‍රිකල්ස් රැපින වීදිය කොලඹ 11** | NR **හාඩ්වෙයාර් මයුර මාවත බෙල්ලන්තොට දෙහිවල** | **ඔරියන්ට් ඉලෙක්ට්‍රිකල්ස්, 'මාලිගාවත්ත කොලඹ 10** | **රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව(මාතර ශාඛාව)** |
|---|---|---|---|---|---|---|

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 150W<br>සෝඩියම් බල්බ්<br>150W<br>ඉග්නේටර්<br>150W චෝක්<br>වීපී පහන් කට්ටල | 950.00<br><br>490.00<br><br>1450.00<br><br>775.00 | 1050.00<br><br>650.00<br><br>1550.00<br><br>850.00 | 1100.00<br><br>550.00<br><br>1600.00<br><br>850.00 | 1350.00<br><br>720.00<br><br>1500.00<br><br>875.00 | 1300.00<br><br>675.00<br><br>1490.00<br><br>825.00 | |
| ඉනිමග(ෆයිබර්) | | | | 78000.00(16×2)<br><br>45000.00(10×2)) | 74700.00(16×2)<br><br>38200.00(10×2) | 65600.00(14×2)<br><br>65500.00(12×2) |
| බණ්ඩල් ලයින් ටැප් | | | | 188.00 | 185.00 | |

- 150W සෝඩියම් බල්බ් ,ඉග්නේටර් ,චෝක්,වීපී පහන් කට්ටල අඩුම හා හොදම මිල ගණන් ඉදිරිපත් කල SKYWAY ඉලෙක්ට්‍රිකල්ස් වෙතින්ද ෆයිබර් ඉනිමග (16×2) ,ඔරියන්ට් ඉලෙක්ට්‍රිකල්ස් වෙතින්ද ,බණ්ඩල් ලයින් ටැප් අඩුම මිල ඉදිරිපත් කල ඔරියන්ට් ඉලෙක්ට්‍රිකල්ස් වෙතින්ද මිලදී ගැනීමට මෙහිදී තීරණය කරන ලදී.

## 10. ලැබීම් හා ගෙවීම් වාර්තා

## 11.වෙනත් කරුණු :-

### ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය

ගරු සභාපතිතුමා ලේකම්තුමිය ඇතුළු ගරු සභාවෙන් අවසරයි. මට අදහසක් දක්වන්න තියනවා. අපේ ඇප්තොප් වත්ත කොම්පෝස්ට් මධ්‍යස්ථානය අසල නිවෙස්වල පදිංචි වෙලා ඉන්නේ. ගංවතුරෙන් හානියට පත් වෙලා ආපදාවට ලක් වෙච්ච පිරිසක්. ඒ අයට ලොකු ප්‍රශ්නයක් තියෙනවා මැස්සන්ගෙන්. ඒ අය තේ එකක් බොන්න ගත්තත් කෝප්පෙ වටේ මැස්සෝ වාඩි වෙනවා. මේක ලොකු ප්‍රශ්නයක්. සෞඛ්‍ය ගැටළු වලට මැදිහත් වෙන්න වෙලා තියෙනවා. ඉස්සර මැස්සන්ට තෙල් වගයක් ගහපු බව ගම්වැසියන් කියනවා. දැන් එහෙම මොකුත් කරන්නේ නැතිලු. මමත් දැක්කා හොඳටම ඒක. අමුත්තෙකුට සංග්‍රහයක් වත් කරන්න අපහසුයි. දැන් අපි දන්නවා පොඩි ළමයෙකුට කෑම කවන්න ගියාම පැයක් විතර තියාගෙන ඒක

කවන්න ඕන. එවිට කෑම එක ගොඩක්ම අපිරිසිදු වෙනවා. ඒක ලොකු සෞඛ්‍ය ගැටලුවක්. ඒ ගැන අවධානය යොමු කරන්න කියලා. මම ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමා මටත් ඔය සම්බන්ධව අදහස් ප්‍රකාශ කරන්න ඕන .ඇත්තටම ඉදිරියට ඔය ගැටලුව වැඩි වෙනවා මිසක් අඩු වෙන්නේ නැහැ. මම යෝජනා කරන්න කැමතියි. මධ්‍යම පරිසර අධිකාරියේ කුණු විද්‍යානුකූලව බැහැර කිරීමේ ක්‍රමවේදයක් සකස් කරලා තියෙනවා. මම හිතන්නෙ ඒ පිළිබඳ කුනු නියමාකාරයෙන් බැහැර කිරීමේ යම්කිසි ක්‍රමවේදයකට සභාවත් එක්ක යන්න පුළුවන් නම් ගොඩක් හොඳයි කියලා හිතනවා. මොකද ලොකු පාරිසරික ගැටළුවක් විදිහට ඉදිරියට පත්වෙන්න තියෙන ප්‍රශ්නයක් ඒක.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. මම යෝජනා තුනක් ගෙනාවා. සූකිරි මහත්මයාගේ නිවස ලගින් ගිං ගඟට බහින තොටුපළත් ඒ වගේම අපට තියෙන මූලික ප්‍රශ්නයක් තමයි. ප්‍රාදේශීය ලේකම් කායර්ාලයේ පවතින. සහකාර ලේකම්වරයකුගේ පුරප්පාඩුව. මොකද අපි බදාදා දිවලවල ප්‍රාදේශීය ලේකම් කායර්ාලට ගියහම ඇත්තටම අපහසුතාවයට පත් වෙනවා. අත්සන ගන්න කෙනෙක් නැති නිසා. ගිය බදාදාත් අපි දැක්ක විශාල පිරිසක් හිටියා. මම දැක්කා එක මනුස්සයෙක් මාත් එක්ක කිව්වා ඒ පිළිබඳව. ඒකයි අපි මේ යෝජනාව ගෙනාවේ. ඇත්තටම අසරණ වෙලා තියෙන්නේ ජනතාව. මට කියන්න කණගාටුයි. ගරු සභාපතිතුමනි. මෙන්න මේ වීථි ලාම්පු ගැන. අපි මේ ගැන යථාවාදීව සිතන්න ඕන. මිනිස්සු ප්‍රකාශ කරනව. ඔබතුමාටත් අගෞරවයක් ඇත්තටම අපට කණගාටුයි. අපේ සභාපතිතුමාට එහෙම කියන හින්ද. මම හිතන්නේ මේ ප්‍රධාන පාරවල් වල වීථි ලාම්පු වැටෙන්නෙ නැහැ. අතුරු මාගර්වල තමයි වීදි ලාම්පු ටික වැටෙන්නේ ගෙවල් ගාව. ඕන්නං මම වීඩියෝ එක උනත් පෙන්වන්නම්. වීථි ලාම්පු දාන්න ඕන සුදුසු ස්ථානවල නෙවෙයි ඒවා සවි කරන්නේ. වීථි ලාම්පු දානකොට ක්‍රමවේදයක් තියෙනවා නේ. වීදි ලාම්පු දානකොට තුන්මං හන්දියක එක්කෝ අඳුරු ප්‍රදේශයක එහෙම තැනක තමයි දාන්න ඕන. ඒ අය කියන්නෙ මේ අපේ මුදලින් ගෙනත් දානවා කියලා. නමුත් අපි ඕන නඩත්තු කරන්න. ඒ අයට පලවෙනි සැරේ බල්බ් එකයි, රු.600 යි,බටෙයි අරන් දෙන්න පුළුවන්. නමුත් ඊට පස්සේ අපි ඒක නඩත්තු කරන්න ඕන. ඒක නිසා එහෙම දාන්න බැහැ. මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ එහෙම ක්‍රමවේදයකට යන්න එපාය කියලා. මේක අපිට හැමෝම කියන කතාවක්. කොහේ බැලුවත්, ඇයි ඔය.ගොල්ලොන්ට මෙහෙම කරගන්න බැරි කියලා අහනවා. මම කිව්වා ගරු සභාපතිතුමා මෙහෙම කියලා තියෙනවා. කොට්ඨාස මන්ත්‍රීවරු පහළොස් දෙනා මගින් තමයි මේවා කරන්නේ කියල. නමුත් දැන් කෙරෙන්නෙත් පරණ විදියටමයි. දැන් අපි මාපලගම කියමු. උඩවැලිවිටිය කියමු. මම දන්නේ නැහැ. යටලමත්තේ වීථි පහන් දාන දවසේ එක බල්බ් එකක් දාන්නඋඩවැලිවිටි තලාවට ගියා. කි.මී.06 ක් ඒ අසවල් නිවසේ මම දන්නවා දානයක් තිබුණා. දානෙට තමයි බල්බ් එක දාලා දුන්නෙ. අපෙන් මිනිස්සු අහනවා පාරෙ දාන්න ඕන තැනට නෙවෙයි දාලා තියෙන්නේ කියලා. වැඩි දෙයක් නොවෙයි කොළඹ කඩේ ලග ඉඳලා වීදි ලාම්පු හතයි ඉල්ලලා තියෙන්නෙ අපි ඒ හත තවම තවම නැහැ. ගරු සභාපතිතුමනි පෙරහැර

මේ පෝයට පටන් ගන්නවා 25, 26, 27, 28, ඇත්තටම එහෙම කරන්න එපා. හැමෝටම මේක දෙන්න පුළුවන් නම් දෙන්න. මම කියන්නේ සභාපතිතුමා අපි ඒ විදියට වැඩපිළිවෙලකට එමු. අපි කිසි තරහක් නැහැ. අපි කියන්නෙ සාධාරණ වෙන්න ඕන. පරිභෝජනය හා ආයෝජනය තියෙන්න ඕන යතාවාදීව. අයතා වාදීව නෙවෙයි මම වැඩිදුර කතා කරන්න යන්නෙ නැහැ. ඔබ සියලු දෙනාට ස්තූතිය පුද කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රිනී කේ.කේ.අයි.නෙරන්ජලී මහත්මිය**

ගරු සභාපතිතුමනි අවසරයි මටත් අර මන්ත්‍රීතුමා ප්‍රකාශයට ලක්කළා වගේ ගිං ගඟ මිටියාවතෙන් බැස යන තොටුපලවල් පිළිබඳව මීට කලිනුත් ප්‍රකාශයට ලක්කලා නමුත් .මේ වනතුරු ඒ පිළිබඳව සුද්ද කරන්නවත් මොනම දෙයකටවත් සේවකයෝ යොදවලා නැහැ. ඒ පිළිබඳව නැවත වතාවක් මතක් කරනවා. ඒ වගේම කැලිකසල සහ කුනු කසල ඉවත් කිරීමේදී නාගොඩ පයර්න්ත රෝහල තුළදී ඒ සඳහා කුණුවලක් නැහැයි කියන එක පිළිබඳව ප්‍රදේශයේ මන්ත්‍රීවරිය හැටියට මට දැනුවත් කිරීමක් කරලා තියෙනවා. ඒ පිළිබඳව අද දින ඔබතුමාට කියනවා. නාගොඩ පයර්න්ත රෝහලේ කුණු වළ කපා දීම සඳහා පොඩ්ඩක් දැනුවත් කරන්න කියන එක ඉල්ලීමක් කරනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රී එන්.ඩබ්. පතිනායක මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු සියලු දෙනාගෙන් අවසරයි. මං හිතන්නේ සභාපතිතුමා මටත් මේ කුණු පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා. මොකද බදාදා දිනයේදී උනන්විටිය පොලේ කුණු අරගෙන ආයෙත් සභා වාහනේ මේ පැත්තෙන් ඇවිල්ලා ඌරල ශෙඩ් එක දක්වා විතරයි යන්නේ. ඌරල වැඩිහිටි නිවාසෙන් දැන් ඉල්ලීම් කීපයක් කරලා තියෙනවා. එතන කුණු ගන්න එන්න කියලා එතන ගන්නම අවශ්‍ය තැනක්. වැඩිහිටියෝ ඉන්නේ. ඒ පිළිබඳ ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියනවා.

ඒ වගේම මටත් වීථි පහන් සම්බන්ධව සඳහන් කරන්න ඕන. මොකද මම ගිය සභා වාරේ සභාවට පැමිණියේ නැහැ. රෝගාතුර තත්ත්වයකට පත් වෙච්ච නිසා. මං හිතන්නේ අපේ විපක්ෂයේ සහබන්දු මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කරලා තියෙනවා. ඌරලට බල්බ් 50 ක් දාන්න ඇති කියලා. මොකද දින පහක් ගියානෙ ඇත්තටම එතුමටත් මම හිතන්නෙ ගනන් හොයලා බලන් නැහැනේ. බල්බ් 24 යි අප ප්‍රදේශයට දින පහක් ගිහිල්ලත් දාල තියෙන්නෙ. 24 න් එකක් සිසිර මහත්තයා දුන්න. ගෙන්නුව මම, ඒකත් ආ විදිය දිනත් එක්ක සටහන් කරන්නම් 04/09 දින විදුලි පහන් 04 යි සවි කළේ. එදා තල්ගස්වල පොලට එන්න කියල මෙහෙන් කැඳවීමක් කරල ආව.ආපහු 04/11 දින විදුලි පහන් 08 යි අටෙන් 06 ක් මෙහේ බල්බ් දැම්මේ අනිත් ඒවා නඩත්තු කළා විතරයි. හයවෙනි මාසෙ විසි වන දින අධික වෂර්ාව හේතුවෙන් බල්බ් 04 යි එදා දැම්මේ. නැවත 06/21 බල්බ් 04 යි සවිකරල තියෙන්නෙ. සේවක රුස්වීම සඳහා සියලු නිලධාරීන් කැඳවලා තියෙනවා. ඒ වගේම 07/04 වෙනිද බල්බ් 08 යි.එදත් 06 ක් අලුතෙන් දැම්ම.කාමරීක දෝශයකට එදා රථය ලක් වුනා. ඒ වගේම ඔබතුමා ප්‍රකාශයක් කරල තියෙනවා. හිටපු මන්ත්‍රීතුමා ධමර්ප්‍රිය මහත්මයලයි කණුවේ ලයිට් එක දැම්මෙ නැහැ කියලා.

ඔබතුමාට දුරකතන ඇමතුමක් මගින් කිව්වයි කියලා. ඔබතුමා පොඩ්ඩක් නිරීක්ෂණය කරල බලලා ඇවිල්ලා කතා කරන්න සභාවේ. ගියපු නිලධාරීන් දන්නවා ඒකෙ ප්‍රේම් එක කඩාගෙන වැටිලා තියෙන්නේ. ප්‍රේම් නැහැ මෙහෙ වයර් මීටර් 10 යි අරන් යන්නෙ දිනකට. ඉතුරු වයර් මම හරි කවුරු හරි දෙනවා. ලලිත් ගාමිණී මන්ත්‍රීතුමාට ගියේ අපට කියලා නෙවෙයි. සභාපතිතුමා දැනුවත්ව එහෙට යවන්න ඇත්තේ වාහනේ. එදින මම දැනුවත් නැහැ. අන්තිමේ අවසානෙ එහේ හදලා එනකොට තමයි, උදේ එකොළහමාරට තමයි මට දුරකථන ඇමතුමක් මගින් දැනුම් දුන්නෙ සේවකයා. අපි ලයිට් හදන්න ආව, මම ඇහුව කොහෙද ඉන්නේ කියලා. තුන් පාරක් ඇහුවට පස්සේ තමයි කිව්වේ. හිටපු මංත්‍රීතුමාගේ ගෙදර ළඟ තමයි ඉන්නේ කියලා. එතුමාගේ ඒව සවිකරලා ඇවිල්ලා එදා අපි අලුත්වැඩියා කළේ වීදි පහන් දෙකයි.මන්ත්‍රීතුමා ඒක වෙලා තියෙන්නෙ ධමර්ප්‍රිය මහත්තයගෙ වීදි පහන් නොදැම නෙවෙයි ප්‍රධාන පාරෙ සියලුම ලයිට් සවි කරලා ආවා. අරක විතරක් දාන්න බැරි මෙහෙ හැඩල් නැති කම නිසා. ඔබතුමා වැරදි වැටහීමක් ඇති කරගෙන. මොකද ඔබතුමා බැලුවෙත් නැනෙ. මම සභාපතිතුමාට ප්‍රකාශයක් කළා යන ගමන් බලාගෙන යන්න කියලා. හැන්ඩ්ල් එක දැන් දෙකට මැදින් කැඩිල තියෙන්නෙ.මේ සේවකයොත් බැලුව. ඒ නිසා තමයි, නැතුව මම ඒක එක එක්කෙනාගෙ කියල අත හැරියේ නැහැ. පියදාස මහත්මයා සහා සේවකයෙක් එතුමගේ නිවස ළඟ එක පමනක් දිනයට පත්තුවෙනවා තවත් දිනට පත්තු වෙන්නේ නැහැ. ඒක එතුමා දානවද නැද්ද කියලා මම සොයා බලන්න ගියේ නැහැ. විදුලිය සම්බන්ධව නම් එපමණයි. එක නිසා වැඩි වෙලා ගන්න බැහැ. ඔබ සියලුදෙනාට දැන් යාමට තිබෙන නිසා බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, ගරු ලේකම්තුමිය ඇතුළු සමස්ත මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, මම දීඝර් වශයෙන් කතා කරන්නේ නැහැ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු 15 දෙනෙක් ඉන්නවා. මම ලැන්ඩ් මාස්ටර් එක පිටිපස්සේ ගියෙ නැහැ. මම ලැන්ඩ්මාස්ටර් එක දකිනකොට කැලැන්ඩරේ එකයි කියලා කපනවා. දෙවනි දවස දකිනකොට දෙකයි කියලා කපනවා. ඒ විදියට ගණන් හදන කොට පනහක් ආවා. නමුත් මේ වීථි ලාම්පු දාන ප්‍රමිතියක් තියෙනවා. ලේකම්තුමිය දන්නවා ඇති. මම හිතන්නේ අපට කෝටා එකක් තියෙනවා. මෙන්න මෙච්චරයි දාන්න පුළුවන් කියලා. අපි ඒක වැඩි කළාට මොකුත් කියන්නේ නැහැ. අපි ඉන්න විටත් ඒක වැඩි කළා. ඒවා දෙන්න ඕන. නමුත් ගෙවල්වල මිදුල් වල නැහැ. ඔබතුමා පිළිගන්නවාද? ගෙවල්වල මිදුල්වලටත් වීථි පහන් දාලයි කියලා. තමුන්නාන්සේලා ගාලු යන උදවිය, ඌරල ෂෙඩ් එකේ පල්ලම බහින තැන ලයිට් එකක් තියෙනවා. ඊළඟ වංගුවෙ තව ලයිට් එකක් තියෙනවා. ඊළගට යන්න එතන තව එකක් තියෙනවා. ඊළඟට පාලම හරියෙ තව ලයිට් එකක් තියෙනවා. මේ පිළිබඳ සොයා බලලා ඊළඟ සභාවේ උත්තර දෙන්න මම හරිද වැරදිද කියන එක ගැන. එක ළඟට පේලි පහක් දාන්න මෙහෙ අවසර නැහැ. අපිට තියෙනවා යම්කිසි කොටා එකක්. ඒ ක්‍රමයට ඕන දාන්න. ඊළඟට ගෙවල්වල මිදුල් වල දාලා තියෙනවා. එහෙම දාන්න බැහැ. අපට එක ලයිට් එකක් වත් එපා. අපි ලයිට් ඉල්ලලා නැහැ. නමුත් මේක මෙතුමා කිව්ව වගේ ප්‍රමිතියක් තියෙන්න ඕන. මගේ මැණියන්ට අවුරුදු අනුවක් වෙනවා. ඒ ගෙදර ලඟ ලයිට් එක අදටත් නිකන් තියෙනවා. පත්තු වෙන්නේ නැහැ. මොකුත් කැඩිලා නැහැ. සාමානායයෙන් හිටපු සභාපතිවරයෙක්, වතර්මානයේ ඉන්න පුද්ගලයෙක් ඒ කණුව පාස් කරගෙන හත් අට වතාවක් එහෙට මෙහෙට යනවා. ඔයාලට

ඒ ගැන දුක නැද්ද? අපේ අම්මත් අවුරුදු අනූවක් වෙනවා. හැන්දෑවට වැට අල්ලගෙන යන එන මිනිස්සු එක්ක තාම කතා කරනවා. මම අපේ අම්මගෙ වයස ගැන කතා කරන්න ආවෙ නැහැ. මිනිස්කම කියන එක සියලු දෙනා ගාව තියෙන්න ඕන දෙයක්. ඉතිහාසය අරගෙන බැලුවොත් විලේගේ සභාපතිතුමාට කියනකොට එකක් දෙකක් යවනවා, දානවා. එඬේරආරච්චි මන්ත්‍රීතුමා හිටියනම් කිව්වම එකක් දෙකක් යවනවා. තමුන්නාන්සේලා අපි එකට වැඩ කළා. මම සභාපති වෙලා හිටිය කාලෙ නිශාන්ත මුතුහෙට්ටිගම මන්ත්‍රීතුමා කිව්වම මම එහෙටත් අවශ්‍ය තැන්වලට කියල යවනවා. අපි හැමදේටම පාට පක්ෂ ගාව ගත්තෙ නැහැ. එහෙමනම් මේවා අනුමත කරන්න බැහැ. අපි විපක්ෂයක් විදියට නැගිට්ටා නම් දොළොස් දෙනෙක් ඉන්නවා. එවිට මේවා අනුමත කරන්න බැහැ. අපි ගෙවන්න කියනවනම්, අපි ගේන්න කියනවා නම් අර වීජී ලාම්පුවක් අපේ මිනිහෙකුට දුන්නහම මොකක්ද වෙන්නේ? ඒක තමයි අපි කියන්නේ අපේ මිනිස්සුන්ට දුක හිතෙන්නේ තමන්ගේ පාක්ෂිකයන්ගෙ ගෙවල් වලට ගිහිල්ලා මිදුල්වලට බල්බ් එක හයි කරල එනකොට. හිටපු මන්ත්‍රීවරයෙක්, තාම රස්නෙ ගියේ නැහැ. ලලිත් ගාමිණී මන්ත්‍රීතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, එක්සත් ජාතික පක්ෂයේ නෙවෙයි. කොයි නීතියද, කොයි පොතේ ද තියෙන්නේ. කඩෙන් ගෙනල්ලා වීදි ලාම්පු සවිකරන්න පුළුවන් කියලා. එහෙම නම් ඔය නීති පොත පෙන්නන්න. ප්‍රාදේශීය සභාවට දෙන සම්මත ප්‍රමාණයක් තියෙනවා. කඩෙන් බඩු ගෙනල්ලා අපට හයි කරන්න පුළුවන්. තමුන්නාන්සේලා අපි විසි හත් දෙනෙක් ඉන්නවා. විසිහත් දෙනා ගෙනැල්ලා හයි කරොතින් හොඳට තියේවි. එක කවදාවත් කරන්න බැහැ. පළාත් පාලන නීතියක් තියෙනවා, ව්‍යවස්ථාවක් තියෙනවා. ඒ නිසා ඒ නොදැනුවත්කමට හරි මේ කරපු දේ වැරදියි. මෙය නිවැරදි විය යුතුයි. අපි සාමූහික වගකීමකින් යන නිසා තමුන්නාන්සේට දෙන සහයෝගය මේ පහළොස් දෙනාගෙන් විතරක් අරගෙන මදි. ගෙනියන්න අමාරුයි. අනිත් දොළොස් දෙනාගේ සහයෝගයත් ඒකට තියෙන්න ඕන. මීට එහා මම වීජී ලාම්පු ගැන කතා කරන්නේ නැහැ. අපට නොදැම්මට කමකුත් නැහැ. අපි දාන්න කියලා කියන්නෙත් නැහැ. නමුත් මම කියපු දේ ඇත්ත. 5 x 10 = 50 යි එතකොට අර වීජී ලාම්පු සවි කරන පුද්ගලයාගේ වේතනය ගෙවීමත් අපට ප්‍රශ්නයක් වෙනවා. එයාට දීලා තියෙනවා කෝටා එකක් දිනකට දහයක්, මගේ කාලේ දොළහයි. දැන් දහයක් දීලා තියෙනවා. නමුත් දවසටම 04 යි හයි කරල තියෙන්නෙ. දිනක වේතනය කීයක් වෙනවද? මාසෙ පඩිය කීයද? මං හිතන්නෙ රු. 35000.00, 36000.00, 37000.00 ක් ඇති. බෙදලා බලන්න අපේ විදුහල්පති මන්ත්‍රීතුමා එක බල්බ් එකකට කීයක් වියදම් වෙනවද කියලා. මේකෙ ක්‍රමවේදයක් තියෙනවා.

ඒ වගේම ඊයෙ රාත්‍රි ගහපු පෝස්ටරයක් තියෙනවා. මේක ගහල තියෙන්නෙ පොදුජන පෙරමුණ නොකිව්වොත් හොඳ නැහැනේ. මම මේ ගැන විසි හත් දෙනෙක් දැනුවත් කරනවා. මේකෙ තියෙන දිනය වැරදියි. 2015 -2018 අපේ තරංග මන්ත්‍රීතුමා මට හරියටම දිනේ කියන්න. 2015 ට පෙර 2006 සිට 2015 වෙනකම් මෙකෙ දිනය වෙනස් වෙන්න ඕන. "හොරකම් කළා" අපේ එක පුද්ගලයෙක් හොරකම් කළාද? මට විලිලැජ්ජයි. "සදාචාරය කෙලෙසුවා" සභාපතිවරු කීදෙනෙක් සදාචාරය කෙලෙසුවද? මෙහෙ නෙවෙයි. කරුණාකර නාගොඩ පටලවගන්න එපා මේවට. සභාපති වරු ඉන්නවා, අකුරැස්ස තංගල්ල මට මතකත් නැහැ. ඔය විදිහට දිගටම ඉන්නවා. එතකොට මේකෙ තියෙනවා. "ආර්ථික වැනසුවා" ආර්ථිකය වැනසුවද? නැහැ. ගම්පෙරළිය හෙට අනිද්දා එනවා. තමුන්නාන්සේලට බැංකුවට ගිහිල්ලා ගන්න පුළුවන්. හෙට අනිද්දා මේවා එනකොට තමුන්නාන්සේලාට කටඋත්තර නැති

වේවි. ජාතික සමගිය ඇති කළේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන්. "පාවාදුන්නා, විකිණුවා" සැන්ග්‍රිල්ලා හොටෙල් එක සින්නක්කර චීනෙට විකුණුවේ අපිද? මත්තල දුන්නේ බද්දට. තමුන්නාන්සේලට පුංචි උදාහරණයක් කියනවා. අහගෙන ඉන්න. අපට කුඹුරක් පාලු නම් කුඹුර අපේ නම් අපි දෙනවා කරන්න කියලා අපට වී මලු මෙච්චර ගානක් අවුරුද්දට ඕන කියලා. අපි මෙච්චරකල් පාඩු ලබපු එක කුඹුරත්, සියලු දේපළත් අපේ. අපට අවුරුද්දට විමලු දහයක් ගෙදරට එනවා. එතකොට පාඩු ලබන දේවල් අපි ලාභදායී මට්ටමට පත් කර ගන්නේ අරක විකුණනවද, සම්පත අපි ආරක්ෂා කරලා රැක ගන්න එක තමයි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කළේ. තමුන්නාන්සේලා සිහින ලෝකෙක ඉන්නවා. 2020 ආණ්ඩු පිහිටුවන්න කවදාවත් සිද්ධ වෙන්නෙ නැහැ. 2020 වෙනකොට රාජපක්ෂලට මේකෙ ජන්දෙ ඉල්ලන්න බැහැ. ඒක මතක තියාගන්න.එක්සත් ජාතික පක්ෂය ස්ථිර පක්ෂයක්.මේවා අර පොහොට්ටුකාරයො,හෙට වෙනකොට පොහොට්ටුව පරවෙන්නත්, නැතිවෙන්න පුලුවන්. මේ කතාව දිග්ගස්සලා වැඩක් වෙන්නෙ නැහැ. මොකද අපි රනිල් වික්‍රමසිංහ දාන්නෙ. බය නැතුව අපි කියනවා ගෝඨාභයට, මහින්ද රාජපක්ෂට එන්න බැහැ. තමුන්නාන්සේලා දාන්නෙ කවුද? අර කවුද ඉන්නවා සභාපති කවුද මම දන්නෙත් නැහැ ජී.එල්. පීරිස් මහත්තයා හොඳයි. සටන එතන තියෙන්නේ. ඒක නිසා ජාතික සම්පත් නැති කරලා රටේ දූෂණය නැති කරල, මේ සියලු දේ විනාශ කරලා ආණ්ඩුවක් වෙනස් කළේ අවුරුදු පහකින් අපි දෙන්න නෙමෙයි. 2020 වෙනකොට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක්, 2022 වෙනකොට එක්සත් ජාතික පක්ෂ ප්‍රාදේශීය සභාවක් කියන එකත් මම තමුන්නාසේලාට මතක් කරමින් නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය**

සභාපතිතුමාගෙන් හා මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. සභාපතිතුමාට පොඩි ස්තුතියක් කරන්න ඕන. වෙරංග මන්ත්‍රීතුමාගේ පළවෙනි යෝජනාව වුණේ අපේ කසල කළමනාකරණය ගැන. ඉතින් අපට මේ අවස්ථාවේදී එතැනට ගියාට පසු දියුණුවක්, ලස්සනක් දකින්න ලැබෙනවා. එදාට වඩා අද දියුණුවක් තියෙනවා. නිසි කළමනාකරණයක් තියනවා. ඒ ගැන මම සතුටු වෙනවා. ඒ ගැන මම සභාපතිතුමාට ස්තූති කරනවා. ඒ වගේම මගේ තව යෝජනාවක් වුනා. පුස්තකාලෙ අඩුපාඩු පෙන්වා දීම. එහිදී අපේ ධර්සිරි ගනේවත්ත මන්ත්‍රීතුමයි පියල් මන්ත්‍රීතුමයි ඒ වැඩ කටයුතු කරල තිබුණා. ඒ ගැනත් ස්තුතිවන්ත වෙනවා. අපිට මෙවර ඒ ස්ථාන වලට ගියාට පස්සේ ලොකු දියුණුවක් තිබුන. පළවෙනි අවස්ථාවේ ගියාට වඩා. ඉතින් ඒ ගැනත් ස්තුතිවන්ත වෙනවා.

තව යෝජනාවක් තමයි මගේ, අපේ ලේකම්තුමිය යොමු කළාද දන්නෙ නැහැ.පාරෙ කාපට් අතුරා තිබීම. උඩුගම සිට  යටලමත්ත මාගර්යේ. මම දැක්කා යනකොට කාපට් අතුරලා තියෙනවා. ඒ යෝජනාවත් කලේ මම. ඉතින් මට සතුටක් දැනුණා ඒව කිරිම ගැන. ඒකටත් ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම මම යෝජනා තුනක් ඉදිරිපත් කරලා ඇති. දැන් වෙලාව නැති නිසා ඒ ගැන කතා කරන්න යන්නේ නැහැ. ඉතින් මම මේ මත්ද්‍රව්‍ය ගැන යෝජනාව ඉදිරිපත්

කරලා තියෙන්නෙ. මං හිතන්නේ අපේ සභාපතිතුමාට ඒක ලිඛිතව දීසර් ලෙස පැහැදිලි කිරීමක් කරලා තියෙනවා. මම හිතනවා එතුමා ඒ ගැන අවධානය යොමු කරලා එයට පිළියමක් යොදයි කියලා. ඇත්තටම සභාපතිතුමනි අද මේ මත්ද්‍රව්‍ය උවදුර විශාල පිළිලයක් වෙලා තියෙනවා අපේ ගමේ. විශේෂයෙන්ම දූවාදරුවන්ට පාරේ යන්න බැරි කමක් වෙලා තියෙනවා. විශේෂයෙන්ම අපේ කාන්තා පක්ෂයට, අපට විශාල දෝෂාරෝපණ ඇවිල්ල තියෙනව. මේ මත්ද්‍රව්‍ය නිසා. විශේෂයෙන්ම මේ කසිප්පු මත්ද්‍රව්‍ය නිසා. මිනිස්සු බීගෙන ගෙවල් වල කාන්තාවන්ට තජර්නය කිරීම, අඩත්තේට්ටම් කිරීම. ඒ වගේම කුඩා ළමයි මේවට ඇබ්බැහි වීම. ඒ කියන්නේ ව්‍යාපාරික ප්‍රජාව ලේසියෙන්ම මේවා විකුණගන්න ගමේ ළමයින්ට, මිනිසුන් සැහෙන ප්‍රමාණයක,ට මේ තරුණ ළමයින්ට, පුංචි ළමයින්ට මේ මේවා දෙනවා. ඒ නිසා විශාල ළමයි සංඛ්‍යාවක් මේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා ඉන්නවා. ඒ නිසා මෙය අපි බිම් මට්ටමෙන්, කොච්චර මේ රටේ මත්ද්‍රව්‍ය ගැන කතා කලත්, ඒවට එල්ලුම් ගහ නියම කළත්, මොන දේ කළත් මේවා නැති වෙලා නැහැ. ඒ නිසා අපි ප්‍රධානව කරන්න ඕන අපේ ප්‍රදේශයේ බිම් මට්ටමින් මෙයට මොනව හරි විසඳුමක් යෙදීම. සියලුම මන්ත්‍රීවරුන් අපි කවුරුත් එකතුවෙලා මොනවහරි ක්‍රියාමාගර්ක් ගමු. පොලිසියත් එක්ක සාකච්ඡා කරල ඒ වගේ මොනවා හරි විසඳුමක් ගමු. ඇත්තටම සභාපතිතුමා අධ්‍යාපනය නවීකරණය වීමත් සමග ඒ ළමයින්ට නිදහස අඩුයි. ළමයින්ට අමතර පංති තියෙනවා. රෑ වෙලා ගෙදර එනවා. විශේෂයෙන්ම කාන්තා පාශර්වයට කාන්තා පාශර්වයට විතරක් නෙවෙයි සභාපතිතුමා පිරිමි ළමයින්ට පවා එහෙම වෙච්ච අත්දැකීම් ගොඩක් තියෙනවා. මං උදාහරණයක් වශයෙන් කියන්නම් මම ඥාති ගෙදරකට ගියා. පුංචි ළමයෙක් ඉන්නවා පාසලේ දෙක වසරෙ. මම ගියාම ඒ ළමය දුවගෙන ඒ ගෙදරට එනව.ඇවිල්ල මට පෙන්වනව අත අද මට ටීචර් ගැහුවා. මට මාර වේදනාවක් ඒ වෙලාවේ ආව. මම ඇහුව ඇයි පුතේ ඔයාට ගැහුවේ. ඉස්කෝලේ වැඩ කරන් ගියෙ නැහැනෙ. ටීචගෙර් වැරද්දක් නෙවෙයි ගැහුවෙ එක. මම කියන්නෙ ඒ ළමයා ඉස්කෝලෙවැඩ නොකර ගිහින් තිබුනෙ ඇයි දන්නවද? අල්ලපු ගෙවල් දෙක. එහාගෙදර අම්මට බබෙක් හම්බවෙන්න ඉන්නවා. තාත්තා වැඩ ඇරිලා රෑට එන්නේ. ඊට පස්සේ අල්ලපු ගෙදර මනුස්සයා බීලා හොඳටම කෑ ගහනවා. හොඳටම බීලා ඇවිල්ලා තාත්තා ගෙදර ඉඳලත් නැහැ. ඒ මනුස්සයාට බැනලා. අම්මා ළමය ඒක අහන් ඉන්න නිසා ළමය නිදි කරවලා. කෑ ගහන හින්දා ඒ ළමයගෙ මානසිකත්වය හොඳ නැහැ. ඉස්කෝලේ වැඩ කරලා නැහැ. අර අහිංසක පොඩි එකා එදා ගුටි කෑවා. ළමා හිංසනයක් එතැන ඇති වුණා. කාන්තාවෝ අපට කියනවා පිරිමි අය බීලා ඇවිල්ලා මේ වගේ දේවල් කරනවා. මේ නිසා ආරක්ෂිතයත් අඩුයි. අපි මේ මත්ද්‍රව්‍යයට බිම් මට්ටමෙන්, පොලිසියත් සමග කතා කරලා මොනවා හරි විසඳුමක් යොදමු කියලා තමයි මම ගරු සභාපතිතුමා ගෙන් ඉල්ලා සිටින්නේ. ස්තුතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා, ලේකම්තුමිය ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. ප්‍රථමයෙන්ම සභාපතිතුමාට ස්තුතිය පුදකරන්න ඕන. පොළ වටේ කම්කරුවෝ දාල සුද්ද කරලා තියෙනවා. නමුත් ඉල්ලීමකුත් කරන්න ඕන. එක පැත්තක් සුද්ද කරන් යද්දි අනෙක් පැත්ත කැලේ වැවෙන තත්ත්වයට පත්වෙලා තියෙනවා. දවස් පහ හයක් කම්කරුවන් යොදවලා සුද්ද කරලා දැනට නවත්තලා තියෙනවා. ඒ නිසා මේ වහින දවස් ටිකේ පොලේ

යන්න බැරි තත්වෙට පත්වෙලා තියෙන නිසා. ඒක කැලේට යන්න නොදී නැවත වාරයක් ඔබතුමාගේ අවධානය යොමු කරලා. ඉතිරි කටයුතු ටික කරන්න කියලා ඉල්ලා සිටිනවා. වෙළෙන්දන්ට වගේම ජනතාවට සාධාරණයක් කරන්න කියන ඉල්ලීම කරන ගමන්ම වීදි ලාම්පු පිළිබඳව අපි දැනට අපේ කොට්ඨාස වලට දවස් දෙක තුන ගිහිල්ලා වීථි ලාම්පු සකස් කරල දීල තියනවා. දැනටත් උඩුගම පාරේ ටිකත් සකස් කරමින් පවතිනවා. ඒ ගැනත් ඔබතුමාට ස්තුතිය පුදකරන ගමන්ම ඉදිරියේදී පොළ නැවත වාරයක් සකස් කරල දෙන්න කියන ගෞරවනීය ඉල්ලීම කරමින් මා නිහඩ වෙනවා.බොහොම ස්තූතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. මේ වෙලාවේ දී විශේෂයෙන්ම පහු ගිය වතාවෙත් සඳහන් කළා. සභාවේ ගෙවීම් වාතර්ාවේ ගමන් වියදම් සඳහා නාම ලේඛනයක් ඉදිරිපත් කරනව. ඒ කුමන කාරයයන් සඳහා ද කියලා සැකෙවින් හරි ඉදිරිපත් කරන්න කියල මම ගිය සභා වාරේදිත් ඉල්ලීමක් කළා. මේ සභා වාරෙදිත් ඉල්ලීමක් කරනවා. මොකද නාමලේඛනයක් පමණයි තියෙන්නේ. මේ තනතුරු සඳහා ඒක සමස්තය බැලුවම මේකේ ඉන්න සියලුදෙනාටම ගමන් වියදම් අය වෙන ක්‍රමයක් තියෙනවා. ඒක කමක් නැහැ. සාධාරණ වැඩපිලිවෙලකින් අයවිය යුතු දෙයක් සභාපතිතුමා. මම මෙහෙම ඉදිරිපත් කලේ මොකද පසුකාලීනව මේ වාතර්ාව අපි ලග තියෙන්නෙ. ඊළහට මේ සභාවේ කතා වුනේ මොනවද කියල බැලුවම. ගෙවීම් වාතර්ා සම්බන්ධ ප්‍රශ්න පැන නැගුනම පසුගිය කාල වකවානුවලදී එහෙම ගැටලුවක් වන නිසා තමයි මම එහෙම ඉදිරිපත් කළේ. ඒ නිසා ඒ පිළිබඳ වත් මේ වෙලාවේ සඳහන් කරනවා. ඒ වගේම මේ වෙලාවේ දී කාල වේලාව ඉක්ම ගියත් අපේ චන්ද්‍ර සහබන්දු මැතිතුමා දීඝර් ප්‍රකාශයක් කළා. බොහොම වේගවත්ව උද්දාමයෙන් යුතුව. එතුමන්ලාට කතා කරන්න තියෙන්නේ ලබන 2020 ගැන නෙවෙයි.මේ කාල වකවානුව ගැන.දැන් ඔබතුමාලට මේ කාල වකවානුව ලැබිල තියෙනව. රජයට සහ රජයේ පාශර්වයන්ට වරදුනු තැනක් තියෙනව.ඒ වැරදුනු තැන තමයි සියලු දෙනා හිතාගෙන ඉන්නේ මේ රටේ ඉන්න මිනිස්සුන්ට ණය ටිකක් දීලා, පාරක් තොටක් හදලා, ඒ වගේම ඉතාම කීතරීමත් ඉතිහාසයක් තිබුනු අපේ මාටරීන් වික්‍රමසිංහ ශූරීන්ගේ කෘතිය සිංහල සාහිත්‍ය පිළිබඳව කියවල බලනවා නම් ගම්පෙරළිය කිව්වම ඇත්තටම අපේ සාහිත්‍යයේ මනසට එන්නේ ඒක. ඒ නිසා මේ වැඩපිළිවෙල ඉතාම හොඳයි. රජය ගත්තු තීරණයක් ඒක අපට විවේචනය කරන්න බැහැ. ඒ පිළිබඳව අපි සතුටු වෙනවා. නමුත් යම් හෙයකින් අසාථර්ක තත්ත්වයකට පත්වුණොත් එතකොට අර ළමයින්ගෙ තියෙන සාහිත්‍ය රසය ගම්පෙරළිය කියන එකත් සම්පූණර්යෙන්ම වෙනස් වෙනවා. එහෙම එකකුත් තියෙනවා. ඉතින් ඒ වගේම සඳහන් කරන්න ඕන. 2020 ආණ්ඩුව ගන්නවද? නැත්ද? කියන එකේ තීන්දුව තීරණය දෙන්නෙ අද මේ රටේ පවතින දේශපාලනික පසුබිම වාතර්ාකරණීය කරගෙන.ඒ නිසා අද රූපවාහිනියෙ චැනල් එකක් දාල බලන්න විදෙස් රටවල නාට්‍ය වෛරය,ක්‍රෝධය පතුරුවන සියලු දේවල් මේ සමාජයේ අනුගත වෙලා තියෙනවා. ඒ නිසා හැමෝටම මේ රටවල් පාලනය කරන්න බැහැ. රට පාලනය කරන්න යම්කිසි පිරිසකට රට භාර දීල තියෙන්නෙ. ඒ අය තීරණය කරන්න ඕන. හොඳ දේ ද නරක දේද කියලා. මට මතකයි අපේ කාලේ පිටරට චිත්‍රපට , නාට්‍ය පෙන්වනවා නම් බද්දක් අය කළා. ඒවා යම් ප්‍රමාණයකට පාලනයක් කරලා තිබුනා. මෙන්න මේවා තමයි පිරිහෙන හේතු.

මත්ද්‍රව්‍ය ගත්තම මම දන්නෙ නැහැ මොන කතන්දර මොනව කිව්වත් පුදුම විදිහට මත්ද්‍රව්‍ය කසිප්පු විතරක් නෙවෙයි ඊට එහා ගිය ඒවා ගම් වලට ඇවිල්ලා. දැන් ez cash මගින් ez cash දමපු කඩේ ළඟ ලයිට් කණුව යට තමයි තියලා යන්නේ. අන්න එහෙම තත්ත්වයක් තමයි උදාවෙලා තියෙන්නේ. මේ රටේ බැලුවම කෘෂිකමර්ාන්තය පදනම් කර ගනිපු රටක්. අද මේ රජයට කෘෂිකමර්ාන්තය සඳහා කිසිම පැහැදිලි වැඩපිළිවෙලක් නැහැ. බලන්න දණ්ඩක් දැම්මොත් ඕනම තැනක පැල වෙන රටක කෘෂිකමර්ාන්තයට කිසිම වැඩපිළිවෙලක් නැහැ. එදා මොනවා හරි එළවළු පැලයක් හරි පැලවෙන්නෙ නැති ඇටයක් හරි තමුන්නාන්සේලා එහෙමනෙ කිව්වේ. එහෙම හරි දීල කෘෂිකමර්ාන්තය ශක්තිමත් කළා. ඒ ආථර්ිකය කෘෂි ආථර්ිකය ශක්තිමත් නොකර තමයි යන්නේ. ඒ වගේම මේ අවුරුදු තුන තුළ ඔබතුමාලා මොනතරම් ආඩම්බරයෙන් කතා කළත් කිසිම ආයෝජකයෙක් මේ රටේ ආයෝජනය කරලා ව්‍යාපෘතියක් ආරම්භ කරලා නැහැ. මේ රටේ ස්ථිර තිරසාර විසඳුමක් සඳහා, ඒ වගේම අද ගමේ සිල්ලර කඩේ වහලා බඩුටික ලොරිය දාගෙන විකුණ තත්ත්වයට පත්වෙලා තියෙනවා. මොකද ඒ තරමට ආදායම් බදු ගහල කඩ වැහීගෙන යන්නේ. මම කියන්නේ ගම්පෙරළිය වැඩසටහන හොඳයි. නමුත් ගම්පෙරළිය වැඩසටහනට එන්න ඕන සමාජීය පසුබිම සමාජයේ පුංචි මිනිහගෙ ආථර්ිකය ශක්තිමත් කරන වැඩපිළිවෙළක් එන්න ඕන. ඒකට ණයක් දෙන එක නෙවෙයි, ඒකට මඟ පෙන්නන්න ඕන. අද මේ රටේ කෘෂිකමර්ාන්තය බින්දුවට වැටිලා තියෙන්නෙ. අන්න ඒවා පිළිබඳව හොයලා බැලුවොත් ඕනම රටක රජයකට ඉදිරි දැක්මක් තියෙනවා. නැති වුනොත් අපි ඔබ තමුන්නාන්සේලා බලාපොරොත්තු නොවුණු තීරණයක් මිනිස්සු ගන්නවා. මිනිස්සු ඒ තරමටම පීඩනයට පත්වෙලා ඉන්නේ. ඒවගේම මම ගිය වතාවෙ කිව්වා යම් දෙයක් ලබා දෙනවා නම් එය ලබා දෙන්නේ එක කණ්ඩායමකට විතරයි. පොඩි කණ්ඩායමට විතරයි මේ සියලු දේ ලබා දෙන්නෙ. අලුතෙන් කෙනෙක් එකතු කරගැනීමේ වැඩපිළිවෙළක් තමුන්නාන්සෙලගෙ රජයේ නැහැ. ඒක මම සඳහන් කළේ නිවාස ණය පෝරම ගන්න ගියත් ප්‍රාදේශීය ලේකම් කායර්ාලයට ඒක තියෙන්නෙ දේශපාලන අධිකාරිය සතුව. මෙන්න මේවා තමයි අඩුපාඩු. මේවා හදා නොගත්තොත් පැවැත්මක් නැහැ. අපි දිවිහිමියෙන් 2020 ආණ්ඩුවක් හදනවා. ඒ වගේම මේ වෙලාවෙ සඳහන් කරන්න ඕන.අපේ සභාපති තුමාට චෝදනාවක් කළා. අපේ මන්ත්‍රීතුමා යටලමත්ත ඉඳලා වැලිවිටියෙ ලයිට් එකක් හයි කරන්න ගියාය කියලා. අපේ මන්ත්‍රීතුමිය මෙතන ඉන්නවා. අපි කාටවත් පෞද්ගලිකව ගෙවල්වලට ලයිට් හයිකරගෙන නැහැ. ඒ වගේම තමයි අපේ ලයිට් හයි කරන්න ගිය දවසේ අපේ මන්ත්‍රී තුමියගේ මහත්තයා තමයි අපට බිස්කට් එක්ක තේ දුන්නෙ. එහෙම අපි වැලිවිටියෙ කවුරුවත් පෞද්ගලිකව ලයිට් හයිකරගෙන නැහැ. වැලිවිටියෙ ජනතාව පිළිබඳ ජනතා විමුක්ති පෙරමුණ ඔයිට වඩා සැලකිල්ලක් දක්වන්න ඕන. ඔබතුමාලට වැඩියෙන් ඡන්ද හම්බුනේ එහෙන්. ඔබතුමාලට ඔය උදව් කරන අය කරන දේවල් මම හෙළි කලොත් මෙතන කතා කරලා වැඩක් නැහැ. ඊළඟට අනිත් එක තමයි යෝජනාවක් දාල තිබුන සහකාර ප්‍රාදේශීය ලේකම් කෙනෙක් ඕන කියලා. ඇත්තටම සහකාර ප්‍රාදේශීය ලේකම් කෙනෙකුගේ අවශ්‍යතාවය තියෙනවා.ලියුමක් ගේන්න ගියහම එහෙම කෙනෙක් නැහැ. ඉතින් මෙතුමාට මම යෝජනා කරන්නේ ඔබතුමාලා මෙතෙන්ට යෝජනා කරන්න එපා. ඔබතුමාලත් මේ යහ පාලනයට සම්බන්ධයි ඔය රතු අලි පැටව් ටික. ගාල්ලේ ඉන්නවා ඇමතිවරයෙක් වජිර අබේවධර්න මැතිතුමා එතුමාට ගිහිල්ල කියන්න. ඔයාලනෙ පත්කරගත්තෙ. මෙතනට යෝජනා දාන්න එපා. සභාපතිතුමාට ඔය යෝජනා ක්‍රියාත්මක කරන්න බැහැ. ඔබතුමාල දැන් ආණ්ඩුව විවේචනය කරලා ජනතාව

නොමග යවන්න හදන්න එපා. ඔය රතු අලි පැටව් තමයි රට නැති කළේ. රට කෑවේ ජනතා විමුක්ති පෙරමුණ. 1989 සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියයි, රණසිංහ ප්‍රේමදාස මැතිතුමයි ජනාධිපතිවරනෙට ඉදිරිපත් වුන වෙලාවෙ මැතිණියට ජනාධිපතිවෙන්න බැරි වුනේ මොකද? දනෙන් පහලට වෙඩි තියනවයි කියලා ශ්‍රී ලංකාකාරයෝ බය කළා. යු,එන්.පී. කාරයෝ ආණ්ඩු බලයට ඡන්දෙ දැම්මා. CTB බස් ටික නැති කලා, transformer ටික ගිනි තියලා සේරම නැතිකරලා ඇවිල්ල, වැඩක් නැහැ ඕවා කතා කරලා. දැන් එනවා සුදනො වෙන්න. මම කියන්නේ අපිට, සභාවට කරන්න පුළුවන් යෝජනාත් තියෙනවා. බැරි ඒවත් තියෙනවා. අපේ මැතිතුමා පෝස්ටරයක් ගෙනැල්ල පෙන්නුවා. අපි මුළු ලංකාවෙම ඊයේ රෑ ඒක ගැහුව. කිසි ගැටලුවක් නැහැ. අපේ පළවෙනි වෙඩිමුරය පත්තු කරලා, අපේ ඉදිරි වැඩපිළිවෙළක් තියෙනවා. මම කවුරුත් විවේචනය කළේ නැහැ. නමුත් මම කිව්වේ ඇත්ත කතාව 2020 දි නැවත රජය ලබා ගැනීම සඳහා අපි යම් වැඩපිළිවෙලකින් යා යුතුයි. නහර පුප්පගෙන බෙරිහන් දීලා මේ වැඩේ කරන්න බැහැ. ඒ නිසා ඔබතුමාල ප්‍රාදේශීය නායකයන් හැටියට විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයට සම්බන්ධ අය හැටියට ඔය රැස්වීමකදී හරි තමන්ගෙ නායකයන්ට කියන්න මෙන්න මේ තත්ත්වය උදා වෙනවා. මේක මගහරවා නොගත්තොත් පැවැත්මක් නැති බව. අපිත් 2020 ආණ්ඩුව ගන්න ගහන්න පුලුවන් සියලුම තුරුම්පු ගහනවා. ජය වේවා.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. වෙන මුකුත් ඕනේ නැහැ. අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්වා එකම පිරිසකට එකම දේ දෙනවයි කියලා. මතක නැතිව ඇති ඒ කාලේ. ප්‍රාදේශීය ලේකම් ගාවින් වාඩි වෙලා මෙයා තමයි වැලි පමරිට් දුන්නේ. ඒ පැත්තේ වෙන කාටවත් දෙන්නෙ නැහැ. පියසේන මහත්තයා ලිස්ට් එක ගන්නවා. මෙයා තමයි වැලි පමරිට් දුන්නේ. මේ දැන් කතා කරන මෙතුමාද, මෙතුමා දැම්ම කොන්ක්‍රීට් එකක් ඉතිහාසගත වෙනවා. ඕන නම් ගිහින් බලන්න. මෙයා දැම්ම වැලිවිටිය කොන්ක්‍රීට් එකක්. මාස තුනෙන් කොන්ක්‍රීට් එක දිය වුණා. රුදවුම් මුදල් ගෙව්වෙත් නැහැ. මෙතුමා මේ කයිය ගැහුවට ඔයා තමයි සේරම කළේ. මෙතුමා ප්‍රාදේශීය සභාවේ JCB එක අරන් යනවා. මේවා කිවුවහම චරිත ඝාතනය වෙනවා. ඒක නිසා මම ඒක ඉල්ලා අස්කරගන්නවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්ව එකම දේ එකම කෙනාට දෙනවා කියලා. මන්ත්‍රීතුමා ඔබතුමාගේ ගමේ සමෘද්ධි නියාමක මහත්තයා, කෘෂිකමර් නිළධාරි මහත්මයා කොහොමද කියලා බලන්න. ලැයිස්තු ටික බලන්න. ඒ ගොල්ල බඩු බෙදලා තියෙන්නේ කාටද කියලා. එකම ඥාතින්ට, එකම සංග්‍රහය තියෙන්නෙ එකම කෙනාට තුන්, හතර පාරක් දීලා තියෙනවා. ඔබතුමාගේ හිටපු ඇමතිවරයා අහනවා. හැමදාම දෙන්නේ මේ අයට නේද කියලා. එහෙම අහපු යුගයක් තිබුණා. දැන් අපි මේ අවුරුදු තුනට මුකුත් දුන්නේ නැහැ කියලා ගමේ මිනිස්සු කියනවා. මෙයා කියනවා දීලයි කියලා. දුන්නේ නැහැ. මන්ත්‍රීතුමා වැඩපිළිවෙළක් තියෙනවා. නිවාස ණය පෝරම ටික දෙන කොට අපි ලග තියෙනවයි කියලා කිනවා. දැන් කියනවා වැඩපිළිවෙළක් නැතෙයි කියලා. හොඳ වැඩපිළිවෙළක් තියෙනවා. ඒක නිසා ගරු මන්ත්‍රීතුමා

පෞද්ගලිකව අපි ඔබට අපහාසයක් කරන්න සූදානම් නැහැ. සමාවෙන්න එහෙම වුණා නම් ගරු සභාපතිතුමනි මෙතනින් බැහැර වෙන්න අවස්ථාව ඉල්ලනවා. සියලු දෙනාට සුබ දවසක්.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමා, ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ලේකම්තුමිය ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. මම මේ වෙලාවෙ දීඝර්ව කතා කරන්නේ නැහැ. මාපලගම හන්දියෙ වීථි ලාම්පු ටික ගැන මම දිගින් දිගටම කතා කළා සභාපතිතුමා. මේ සැරේ වීදි ලාම්පු ටික ගෙනල්ලා ගලවලා අලුත්වැඩියා කරනවා. ඒකෙ තිබුන ලයිට් සෙට් එක නැති වුණාට කමක් නැහැ. සී එෆ් එල් බල්බ් හරි දාලා අපි ඉක්මනට ලයිට් ටික හයි කරල දෙමු. . සී එෆ් එල් වෙට් 65 වගේ බල්බ් එකක් දැම්මහම ඒකට චෝක් එකක් ඕන නැහැ. බල්බ් එකක් දාල දැනට හයි කරල තියනව. දයානි එක ඉස්සරහ හොඳට එළිය තියනවා. ඒක එහෙම හරි අපි වීථි ලාම්පු ටික ඉක්මනටම මාපලගම නගරේ සවිකරමු. මාපලගම නගරෙ තමයි ගොඩක් හරිය ඔය ප්‍රශ්නේ තියෙන්නේ. දැන් දීඝර් කාලයක්ම කතා වෙන්නේ, ඒක නිසා ඒ කටයුතු ටික කරලා දෙන්න කියලා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම මත්ද්‍රව්‍ය ගැන අපේ අරුණ ශාන්ති මන්ත්‍රීතුමිය කතා කළා. ලොකුම ප්‍රශ්නයක් තමයි කවුරුත් කතා කරන්නෙ මේ මත්ද්‍රව්‍ය ප්‍රශ්නය. මේකෙ යටගියාව දිහා බලන කොට, මේ කටයුත්ත ක්‍රියාත්මකවීම දිහා බලනකොට, මගේ ගමේ මගේ කොට්ඨාසවල මත්ද්‍රව්‍ය ක්‍රියාකාරකම් කරන පුද්ගලයෝ දිහා බැලුවයින් පස්සෙ සභාපති තුමා කියන්න කණගාටුයි. මොකද පහුගිය කාලේ ඔබ තුමාලත් එක්ක වැඩ කරපු, මේ පොහොට්ටුව පක්ෂෙත් එක්ක වැඩ කරපු අය තමයි මේ ව්‍යාපාර කරන්නේ. හදිස්සියේ එක්කෙනෙක් දෙන්නෙක් යූඇන්පි කාරයෝ ඉන්නවද කියල කියන්න දන්නෙ නැහැ. අපේ ගම් වල නම් නැහැ. හැබැයි මේ ව්‍යාපාරය මේ තරම් දැඩි ලෙස ව්‍යාප්ත වෙන්න මූලික හේතුව තමයි. තමුන්නාන්සේලා මැතිවරණ කාලයේදී මේ අය අරගෙන දේශපාලන ධාරාවේ කටයුතු කළා. ඒක හින්දා මේ අයට වෙන දෙන්න ප්‍රතිලාභයක් නැති හින්දා මේ කසිප්පු, අරක්කු, කුඩු විකුණලා තමයි ජීවත් වෙන්නේ. ඉතින් මේක දැන් තියෙන නීති පද්ධතිය තුළ පොලිසියට කසිප්පු අල්ලලා නඩු දාන්න යම් නීතිමය අවහිරකම් තියෙනවා. ඒක ඉදිරියේදී ඉවත් වේවි. ඉතින් මේ වෙලාවේ පොලිස් විශේෂ කාර්‍ය බලකාය ඒ කණ්ඩායම් ඇවිල්ලා වැටලීම් කරනවා. මේ විසබීජ උඩු දුවලා තියෙන්නේ. හැබැයි ඕක පසුගිය කාලේ, කට්ටිය මතට තිත කියලා රාජපක්ෂ මහත්තයාගේ කාලේ ගැන කවුරුවත් කතා කරන්නේ නැහැ. ඒ කාලෙත් ඔය වගේ තමයි. මතට තිත කියලා වැඩසටහන් තියාගෙන අරක්කු තැබෑරුම් පෝලිමට විවෘත කරලා, මේ ගම්වල මත්ද්‍රව්‍ය ව්‍යාප්ත කළා. අපි දන්නවා ඒවා. අමතක වෙලා තමුන්නාන්සේලට. මේ අද අපේ කාලේ දිහා දිගින් දිගට කතා කරන්නේ. මම හිතන්නේ තමුන්නාන්සේලා මේකට යම් මට්ටමකට වගකියන්න ඕන. මෙතන ඉන්න දේශපාලන ධාරාව අය, බොරු නෙමෙයි ඇත්ත කියන්නේ. ඔප්පු කරල පෙන්නන්න පුළුවන්. මේ කසිප්පු විකුණන ජාවාරම් වැඩිහරිය ඉන්නෙ. තමුන්නාන්සේලා එක්ක ඡන්දෙ කරපු අය. ඒක තමයි ඇත්ත කතාව. හැබැයි තමුන්නාන්සේලට පුළුවන් මේවා නවත්වන්න. තමුන්නාන්සේලා අපිට ඇඟිල්ල දික්කරනවා. ආණ්ඩුවට, ගමේ

කසිප්පු විකුණන ගමන්අපට ඇතිල්ල දික් කරනවා.මෙන්න කසිප්පු තියෙනවයි කියල. ඒ ව්‍යාපාර කරවන ගමන් ආණ්ඩුවට ඇඟිල්ල දික් කරනවා. අද හැමතැනම කසිප්පු ය කියලා.

හැබැයි ඒක බලාගන්න ඉදිරි මාස කීපය තුල කවුද කරන අය කියල. දැනට පොලීසියෙන් ඇහුවොත් දැනගන්න පුළුවන්. පහුගිය කාලේ වැටලීම් කරලා අත් අඩංගුවට ගත්තු අය ඉන්නවා. ඒ අයගේ දේශපාලන ධාරාව මොකක්ද කියලා ඇහුවොත් පොලීසියෙන් අහගන්න පුළුවන්. තමුන්නාන්සේලාට. මොන පැත්තටද වැඩ කළේ කියලා. එතකොට ඇත්ත කතාව දැනගන්න පුළුවන්. මත්ද්‍රව්‍ය ගැන ඔයිට වැඩිය කතා කරන්නේ නැහැ. මත්ද්‍රව්‍ය මේ පළාත්වලින් තුරන් කරන්න වැඩසටහනක් ඉදිරියේදී සකස් කරල තියෙනවා. ඉතින් ඒ වෙලාවෙ දී තමුන්නාන්සේලාට අසාධාරණයක් වෙයි. තමුන්නාන්සේලාගේ පස්සෙන් ගිහින් ඡන්දය කරපු කට්ටිය අපට ජීවත් වෙන්න විදිහක් නැතෙයි කියලා. හැබැයි ඒ වෙලාවට තමුන්නාන්සේලා බලාගන්න. ඒ වගේම සංවධර්නය ගැන කතා කලත් තව විනාඩියක් කතා කරලා, මම හිතනවා කට්ටියට ලොකු අමාරුවක් තියෙනවා. ගම්පෙරළිය අපේ මේ වචන අරගෙන වැරදි අථර්කතනයක් දීලා පූවර්ාදශර්යක් දෙන්න හදනවා. අපි මාටරීන් වික්‍රමසිංහ මහත්තයාට අසාධාරණයක් අපහරණය වෙන්න නෙවෙයි. හැබැයි ගම්පෙරළිය කියන වැඩසටහන තමුන්නාන්සේලාට දැනගන්න පුළුවන් වෙයි, මේ ජනවාරි පෙබරවාරි ලබන අවුරුද්දේ මුල අප්‍රේල් වෙනකොට මේ ගම්පෙරළියෙන් මොකක්ද ගමට කෙරෙන්නේ කියලා. අපි මේ වන විට වත්මන් රජයේ ගරු අගමැතිතුමන් දැවැන්ත වැඩසටහනක් ගම තුළ ක්‍රියාත්මක කරන්න අවශ්‍ය යෝජනා ප්‍රාදේශීය ලේකම් කායර්ාලයට එවලා තියෙනවා. ඒවා ඇස්තමේන්තු කරලා ගමේ සංවධර්න කටයුතු කෙරෙනකොට තමුන්නාන්සේලාගේ කට ඇරෙයි. ගම්පෙරළියෙන් මොකක්ද කළේ කියලා. ඊට අමතරව ගමේ මේ අවුරුදු තුන තුළ රාජපක්ෂ මහත්තයලගෙ ආණ්ඩුවෙන් කරන්න බැරිවෙච්ච අති විශාල වැඩ කොටසක් කළා. මේ ඉන්න මන්ත්‍රීවරු දන්නව ඇති. තමුන්නාන්සේලා මා දන්නෙ නැහැ උඩද බිමද කියල හිටියෙ. අහන්න ධමර්සිරි මන්ත්‍රී තුමාගෙන්, අපේ කොට්ඨාසවල මේ අවුරුදු තුන තුළ රාජපක්ෂ මහත්තයා ගල්වාන උඩුගම පාර තාර ටිකක්වත් දාන්න බැරි වුනා. පැච් එකක් දාල යන්තම් රැවැට්ටුවා. අද ගල්වාන උඩුගම පාරේ හොඳට වාහනයක් වැඩ කරනවා. ඒ වගේම සෞඛ්‍ය මධ්‍යස්ථාන පාර, මේවා කරනකොට මේ කට්ටිය බොහොම බලන් හිටියා. මේ වගේ නෙමේ අද මාපලගම පනංගල පාර, නාගොඩ බද්දෙගම පාර අර පැත්තෙන් ඇල්පිටිය පාර කාපට් බිඳක් මේ පැත්තේ නොදැකපු යුගයක, මේ අවුරුදු තුන තුළ අපි කළා. ඒවා ඉතින් මං හිතනවා ඇත්තටම මේ ගොල්ලන්ට රාජපක්ෂ මහත්තයලගෙ කට්ටියට බලන් ඉන්න බැරුව ඇති. නමුත් තමුන්නාන්සේලා, මං හිතනවා අද මිනිස්සු අවංක හදවතට එකඟව කතා කරනවා නම් මේ අවුරුදු තුන තුළ ලැබිච්ච ප්‍රතිලාභ මම හිතනවා අවුරුදු තිහකට හතළිහකට එහා ජනතාවට ලැබුණේ නැහැ. අර ගංවතුර වෙලාවේ වතුර බැහැල යනකොට මොන ආණ්ඩුව ද යටවෙච්ච ගෙදර තිබුන බඩු මුට්ටු වලට ගෙදර තියෙන බඩු මුට්ටු වලට ගෙදර තියෙන බඩු මුට්ටු දීලා, දීපු සල්ලි කන්දරාව කොච්චරද? කොයි ආණ්ඩුවෙන්ද දුන්නේ? මේවා අහගෙන ඉන්න තමුන්නාන්සේලා ලබන අවුරුද්ද වෙනකොට 2019, 2020 වෙනකොට බලාගෙන ඉන්න මොකක්ද මේ පලාත් වලට වෙන්නේ කියලා. හැබැයි එතකොට තමුන්නාන්සේලාට බලාගත හැකි ඇත්තටම අද මිනිස්සු කම්පා වෙනවා. අපි මේ වැරදි ගමනක වැරදි කෙනෙක් එක්ක පස්සෙන් ගියා කියලා. මොකද මේ පොහොට්ටුවේ ගමේ ඉන්න නියෝජිතයෝ ගිහිල්ලා ගෙදරට කිව්වෙ රාජපක්ෂ මහත්තයා තව මාස දෙක තුනකින් ජනාධිපති වෙනවා.

පාලරීමේන්තු බලය අපි තමයි මෙහෙයවන්නෙ. ඡන්දෙ අපට දෙන්න කියලා. දැන් දීලා බලාගෙන ඉන්නවා කෝ මුකුත් නැහැ. හැබැයි අපි දන්නවා වැල නොකැඩී අපේ පස්සෙ ගෙවල් වලට මිනිස්සු එනවා. අපි වැරදීමකින් මහත්තයා , අසවලා පස්සේ ගියා අපට උදව් කරන්න කියලා. අපි උදවු කරනවා. මොකද අහිංසක මිනිස්සු ගම්වල ඒ මිනිස්සු වැරදි වැටහීමක් ඒ වෙලාවෙ තිබුණා. වැරදි මිනිස්සුන්ගෙ පාරෙ ගිහිල්ල ඒ මිනිස්සු අමාරුවෙ වැටිලා තියෙන්නේ. ඉතින් මං හිතනවා කතා කරන්න බොහෝ දේ තියනවා. මෙතුමා කිව්වා කෘෂිකමර්ාන්තය පිළිබඳ, කෘෂිකමර්ාන්තය පිළිබඳව අපටත් වේදනාවක් තියෙනවා. නමුත් කෘෂිකමර්ාන්තයත් ඉදිරියේදී සෑම ගමකම තියෙන සෑම කුඹුරු බිම් අඟලක්ම වගා කරන වැඩසටහනක් ක්‍රියාත්මක වෙන.වා හැබැයි නොකරන, කරන්න නොදෙන කණ්ඩායමක් ගමේ ඉන්නවා. මොකද තමුන්නාන්සේලාගේ දේශපාලන ධාරාවේ ඉන්න හෙන්වයියලා ටිකක් ගමේ ඉන්නවා. මේවා කඩාකප්පල් කරනවා. ඉතිං ඒක හින්දා තමයි මේ වැඩපිළිවෙළවල් කඩාකප්පල් වෙන්නෙ. මෙන්න මේවා නොකිය බැහැ. අහන් ඉන්න බැහැ. මොකද මේ කට්ටිය හරියට උඩින් පාත් වෙච්ච බබ්බු වගේ කතා කරන්න යන්නේ කියලා කතා කරන්නේ. තමුන්නාන්සේලා ඉදිරි 2020 වෙනකොට බලාගන්න. මේ රට කොයිබටද යන්නෙ කියලා. අවුරුදු තිහකටවත් මේ යූඑන්පි ආණ්ඩුව දෙන්නෙ නැහැ. මහින්ද රාජපක්ෂ මහත්තයට කියන්න ඔය මැදමුලන කුඹුරක් කොටා ගෙන ඉන්න කියලා. අවුරුදු තිහක් විතර කරල පුළුවන් උනොත් දෙන්නම් කියලා.

**ගරු මන්ත්‍රී විජිත් වීරගුණරත්න සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා, ලේකම්තුමිය ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. ගරු මන්ත්‍රීතුමන්ලා බොහොම වාද විවාද කරපු අවස්ථාවක හෙට ගමන යන්න තියෙද්දී දීඝර් වශයෙන් කතා කරන්න අවශ්‍ය නැහැ. එත් අපි කතා කරන්න ඕන. උඅරලට, අපේ මන්ත්‍රීතුමාල දෙන්නට මම ගිය සැරෙන් කතා කළා. මේ ලයිට් ප්‍රශ්නේ. නිකං නෙමේ සභාවේ ලයිට් වාහන යන කොට වැඩක් කරනවයි කියලා හරි ජේනවා. සභාපතිතුමා ඇත්තටම සතුටු වෙන්න ඕන. 4 හැදුවත් ගියානේ . ඉතින් යටලමත්තට එක දවසයි ආවෙ. එක දවසයි ආවෙ එදා ආපු දවසේ මේ මන්ත්‍රීතුමා කියනවා වැලිවටිත් ගියයි කියලා. වැලිවිටි නම් ගිහිල්ලා නැහැ. ගරු සභාපතිතුමා නොසැලකුවත් අපි ඔබතුමා ආරක්ෂා කරනවා. අපි ඒ ගැන හරි සතුටු වෙනවා. ඒ නිසා අපි කියනවා විශේෂ අවධානය යොමු කරන හැටියට යටලමත්තට. මොකද ඔබතුමාගේ ඥාති හිතවතුන් ඉන්නේ ඒ නිසා. ඒ පිළිබඳ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම අපේ වසන්ත කුමාර මන්ත්‍රීතුමාලා කතා කරපුවා ගැන අපි එච්චර කතා කරන්න යන්නේ නැහැ. මොකද අපි හෙට හමු වෙනවා. එකට කන්නේ, බොන්නේ. ඒ වගේම අපේ විපක්ෂයේ ප්‍රධාන නායකතුමා, සහබන්දු මහත්තයා කතා කළා. අපේ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඔබතුමාලගේ, අපේක්ෂකයා හැටියට එනවා කියලා අපිට බොහොම සන්තෝසයි. මොකද ඔබතුමාලාගේ නායකතුමා ආවොත් අපි අනිවායෙර්න්ම දිනනවා. තමුන්නාන්සේ තමයි ඔතන ඉඳගෙන කිව්වේ අපි දන්නවා මේ සභාවේ කැම්ප් එකෙන් ගිහිල්ලා ඔබතුමා තමයි එතුමාගේ නම යෝජනා කරලා, පස්ස දොරෙන් පැනලා ආවේ. අපි දන්නවා ඔබතුමා අපේ සභාවේ වාහනෙන්ම ගිහිල්ලා යෝජනා කරලා තමයි එතුමා නායකත්වය ඉන්නේ. ඒ නිසා තමයි එතුමා අද අගමැති වෙලා ඉන්නේ .තමුන්නාන්සේට

මොකද වුනේ මං අහන්නේ ඔබතුමා අද එතනමයි. මේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීකම තමයි යන්තම් හම්බ වුනේ. අපි සතුටු වෙනවා. ඔබතුමාල නරක මිනිස්සු නෙමෙයි. ඔබතුමාලා හොඳ මිනිස්සු. ඔබතුමාලට මොකක්ද කලේ .ඔබතුමාලට කරන්න බැරි වුන එකේ අපේ ගමේ මිනිස්සුන්ට මොකක්ද වෙන්නෙ. ගරු සභාපතිතුමනි සමාවෙන්න මෙතුමලට මේවා වෙලාවෙ හැටියට නොකියත් බැහැ. මොකද ගම්පෙරළිය ගැන මහලොකුවට කතා කරනවා. ගම්පෙරළිය කරල ඉවර උනාම කට ඇරෙයි කිව්වා. අපේ වසන්ත මන්ත්‍රීතුමා කට ඇරේවි. කොහොමත් කට ඇරෙනවා අපට විශ්වාසයි. ගම්පෙරළිය අපි දන්නවා. ගමට ආපු සල්ලි මම ප්‍රාදේශීය ලේකම් තුමාගෙන් ඇහුවා. මිලියන 20යි ඇවිල්ල තියෙන්නෙ. ප්‍රාදේශීය ලේකම් කායර්ාලයටම. ඔබතුමාලා ඕක කරනකොට අපට ඉතුරු ටිකත් ඒවි. ඔබතුමාලා ගම්පෙරළිය කරනකම් තමයි අපි ඉන්නේ. තමුන්නාන්සේලා කතා කළා ගම්පෙරළිය කරන්න සල්ලි ගන්නෙ අපේ අර ගලක් යැයි ඔප්පු වරාය විකුණන් හම්බන්තොට වරාය විකුණලා. ඒවා සල්ලි වුණාම තමයි ගම්පෙරළිය කරන්න යන්නේ. අන්තිමට ගම් පෙරළියත් එක්කම රටම පෙරලෙනවා.

ඒ වගේ ගමේ කසිප්පු ගැන කතා කළා. කසිප්පු පෙරන්න අපේ කට්ටිය කියලා තමුන්නාන්සේලාගේ ආණ්ඩුවක් තියෙන්නේ අල්ලන්නකෝ අපි කැමතියි අපේ කට්ටිය උනාට කමක් නැහැ. වැරදි වැඩ කරනවා නම් අල්ලන්න කවුරු කළත් අල්ලලා නඩු දාලා මහින්ද මහත්තයාගේ කාලය අපි ඒවා හරියට කලා. තමුන්නාන්සේලාගේ කට්ටිය ඇල්ලුවා. තමුන්නාන්සේලා අපේ කට්ටිය අල්ලන්න අපි හරියට කළා. අපි හරියට කරනවා. තමුන්නාන්සේ බලාගන්න තමුන්නාන්සේලා එක්ක වැඩි වේලාවක් කතා කළ යුතු දේවල් තිබුනත් හෙට හමු වෙන නිසා කතා කරන්නේ නැහැ. කාල වේලාව ඉක්ම යන නිසා ගරු සභාපතිතුමනි මගේ කතාව අවසන් කරනවා. සියලු දෙනාටම සුබ අනාගතයක් ප්‍රාථර්නා කරනවා.

**ගරු මන්ත්‍රී ධමර්සිරි ගනේවත්ත මහතා**

සභාපතිතුමනි, අද දවසේ කතා කරන්න වත් අවස්ථාවක් ගන්න හිතාගෙන හිටියේ නැහැ. මොකද කතා කරන්න දේවල් තිබුනෙත් නැහැ. කතා කළ දේවල් වුණෙත් නැහැ. සභාව තුළ අපි යෝජනා කරපු දේවල් සිදු නොවුන නිසා කතා කල යුතු නැහැ කියලා මතයක් තිබුණා. මෙතැනදි අන්තිම මොහොතේ කතාකරන්න නැගිටින්න සිදුවුණේ , ඇත්තටම මම කනගාටු වෙනවා. කතා කරපු විදිහ ගැන. ජේෂ්ඨ මන්ත්‍රීවරු වගේම නවක මන්ත්‍රීවරු අපි නවකයො හැටියටත් ,අපි මේ සභාව රැස් වෙලා වටිනා කාලය මිඩංගු කර ගෙන නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවධර්නය වෙනුවෙන් කතා කරනවා නම් ඇත්තටම වැදගත් වෙනවා. අපට අවශ්‍ය වෙලා තියෙන්නේ ඒ කටයුත්ත කරන්න. අද දවසෙත් ළමයි හතර දෙනෙක්ගේ තාත්තා කෙනෙක් හැටියට සමාජයේ යම් වැඩක් කරන්නම් බාරදීපු පුද්ගලයෙක් හැටියට මෙතන කාලය ගත කරද්දි අපි කැමති වෙන්න ඕන. මම නම් ආසයි මේකෙ යම් දෙයක් කරන්න පුළුවන් නම්. මුදල් නැතත් අපේ ශ්‍රම ශක්තියෙන් යම් දෙයක් කරන්න කාලය වෙන් කරගෙන ඒවාට අවශ්‍ය කරන කාරණා කතා කරනවා නම් මම හරි සතුටුයි. නමුත් අපිට මේ වෙලාවේ මන්ත්‍රීවරයෙක් චෝදනා කරනවා නම් එයට උත්තර දිය යුතු වෙනවා. අපි නිහඬව හිටියොත්

ඒක තමයි සමාජගත වෙන්නේ. මම හිතන්නේ ඔය කතා කරන හැම ඒවටම 2020 වෙනකොට ජනතා තීන්දුව ලැබේවි. ඒක නිසා අපි කලබල වෙන්න අවශ්‍ය නැහැ. ඒ මොන දේ වුණත් ජනතාව ගන්න තීරණය තමයි නිවැරදි තීරණය ඒක නිසා තමයි අපි පහළොස් දෙනෙක් මේ පක්ෂයක් හැටියට එකතු වෙලා අලුතෙන් නිමර්ාණය වුනත්, අපි මෙතන වාඩිවුනේ, මෙතනදි අපේ කොට්ඨාස මන්ත්‍රීතුමා වසන්ත කුමාරගේ චෝදනා කළා. කොට්ඨාසය තුළ අපිට ඡන්දය පාවිච්චි කරපු අය කසිප්පු නිෂ්පාදනයේ ඉන්නේ කියලා. හැබැයි මම එක සංඛ්‍යාලේඛනවලින් කියන්න දන්නේ නැ.හැ හරියට රජයේ නිලධාරීන් නම් වැඩි වශයෙන් ඡන්දේ පාවිච්චි කළේ මගේ කොට්ඨාසෙ මට. ඒ ගොල්ල ගැනනම් මට සංඛ්‍යාලේඛනවලින් මේගොල්ලො කරා කියලා කියන්න පුළුවන්. අපිත් එක්ක ඉන්නවා වගේම අනිත් පැත්තෙන් රැස්වීම් වලට ගිහිල්ලා එහෙම හිටපු ජනතාව පීඩනය දරාගන්න බැරුව අද පන්සලට දානේ දෙන මනුස්සයා තමයි කසිප්පු පෙරන්නේ. ඒක අපි දකිනවා. එදා මේ වගේ පමරීට් එක දුන්න වගේ නම් කළේ නැහැ. අද කිසි ප්‍රශ්නයක් නැතුව ඕන තැනක බය නැතුව පමරීට් අරගෙන වගේ ඒ දේවල් කරනවා. මේ රටේ නීතියක් ඇවිල්ලා දකුණු පළාතට, පොලිසියට මේවා අල්ලන්න තහනම් කරලා තියෙනවා. ඒක අද මෙතන කතා කරන අයට පුළුවන් පාලකයන් දැනුවත් කරලා, සංවධර්න කමිටුවේ නිතර කතා කරන පොලිසියෙන් අපට බලයක් නැහැ කියල කියන මේ දේ ගැන පාලක පක්ෂයේ ඔබේ මැති ඇමතිවරුන්ගේ ඇහැ අරවන්න. අපේ පක්ෂයට, අපට කාටවත් චෝදනා කරන්න එපා. මම නම් කවදාවත් ගමේ ගිහිල්ලා බීලත් නැහැ. බොන්නෙත් නැහැ. ඒවට උදව් කරන්නෙත් නැහැ. අන්න ඒ වගේ තියෙනවනම් මේ දේශපාලන පක්ෂය නියෝජනය කරන කෙනාට ඇඟිල්ල දික් කරාට කමක් නැහැ. ඔය කවුරුවත් කාටද ඡන්දෙ දුන්නෙ කියලා අපි කවුරුවත් දන්නේ නැහැ. ඒකනිසා ඔබතුමාලගේ චෝදනාවක් මම තරයේ ප්‍රතික්ෂේප කරනවා. සංවධර්නය ගැන කිව්වා. අපි මන්ත්‍රීතුමා ඇත්තටම හරි සතුටු.යි එතුමාට කරන්න ඉඩ තිබුණේ කිලෝමීටර් නවයක පාරේ මීටර් 100 ක වලවල් වහනවා වගේ ප්‍රමාණයක්. එතකොට ඔය කිලෝමීටර් නවය සංවධර්නය කළේ ඔබතුමාද?

ගුරු පාර තිබුණ. පාරෙ තාර දාලා. කාලයක් පාවිච්චි කරපු පාර. ඒ ආණ්ඩුව ඉවර උනාට පස්සේ පාරේ පැච් ටික දාල පාර හැදුවයි කියලා කියන්න එපා. පාර හැදුවෙ ඉස්සෙල්ලා තිබුන ආණ්ඩුව. ඒක අපේ සල්ලි තමයි සියලු දෙනාගේ බදු මුදලින්, නැතුව මේක ඔබතුමා කරා කියලා කියන්න එපා. එම්.එස්. අමරසිරි මැතිතුමා මේ පාර කපන්න උදව්කළා. පාර නිමර්ාණය කරන නිමර්ාතෘ හැටියට මම එතුමාට ගරු කරනවා. ඒ වගේම පන්සලේ හාමුදුරුවන්ට, හැබැයි මේකෙ තාර දැම්මේ පියසේන ඇමතිතුමාගේ නායකත්වයෙන්. මේකේ තාර දානකොට අමරසිරි මැතිතුමා බලයේ නැහැ. ඊට පස්සේ කපල්විල පාර තාර දාල තියෙන්නෙ එතුමන්ලා තමයි. නමුත් පැච් එකක් දැම්ම පලියට මහින්ද මහත්තයාගේ කාලෙම කළේ නැති දේවල් කළා කියන්න එපා. ඇත්තටම මට වැඩක් නැහැ ඒවා. ඒ නිසා මම වැඩිය කතා කරන්නේ නැහැ. බොහොම හොඳයි මම සියලුම මන්ත්‍රීවරුන්ට ස්තුති වන්ත වෙනවානිහඩව මගේ කතාව කරගෙන යන්න ඉඩ ලබාදීම ගැන. ඒ වගේම සියලු දෙනාට තෙරුවන් සරණ ප්‍රාථර්නා කරනවා. උදේ යන ගමන ගැන සියලු දෙනා දැනුවත් කරනමෙන් ඉල්ලා සිටින අතර සියලු දෙනාට තෙරුවන් සරණයි මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. සභාවාරය අවශ්‍යතාවය අනුව කලින් නිම කිරීමට සිදුවීම ඇත්තටම දුකක්. අපේ අජිත් එඬේර ආරච්චි මංත්‍රීතුමා, බන්ධුල මන්ත්‍රීතුමා, නෙලී මන්ත්‍රීතුමිය අද කොළඹට කැඳවීම නිසා පැමිණීමට නොහැකි බව කලින්ම දැනුම් දුන්නා. මම හිතුවා අද මීට වඩා අබර්‍ුදකාරී තත්වයක් මතු වෙයි කියලා. මොකද අපේ මන්ත්‍රීතුමන්ලාගේ විෂය පථය අනුව සමහර අවස්ථාවල සභාවේ අපට අවශ්‍ය නැති, අපේ විෂය පථයන්ට අදාළ නැති ඒවත් කතාවෙනවා. අපි නිතරම බලන්න ඕන. ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා, අපේ ප්‍රාදේශීය සභාවට අදාළ කරුණු කාරණා, මෙතනින් මතුවෙන ප්‍රශ්න ඒවට අවශ්‍ය උපදෙස් ලබා දීම. ඒ අඩුපාඩු පෙන්වා දීම. රටක් වශයෙන් ගත්තොත් ඒවත් කතා විය යුතුයි. නමුත් ඒ කතා හිස් සම්ප්‍රප්පලාප වෙනවා. ඒකට හේතුව අපේ වසන්ත මන්ත්‍රීතුමා, අර ධමර්සිරි මන්ත්‍රීතුමා කිව්වා වගේ පාරේ යම් ප්‍රතිසංස්කරණයක් කරාම ඒක මහින්ද මහත්තයා මේ අවුරුදු ගානටම කරපු නැති දෙයක් වගේ තමයි පෙනුනෙ. කමක් නැහැ එතුමන්ලාට පේන්න ඕන ඒක. මොකද නැත්නම් හොඳ මදි. කොහොම නමුත් අපි කවුරුත් මෙතනට එන්නේ අවංක හදවතින්, මේ ප්‍රදේශයට කාටත් සේවයක් කරන්න. නැතුව බඩ වඩා ගැනීමේ සම්ප්‍රදායෙන් නෙවෙයි. කව්රු කොහොම කිව්වත් ආවට පස්සේ යම් වෙනස්වීම් වෙනවා. ඒක මේ සමාජයේ හැටි. අපි කිසි කෙනෙක් මේ ප්‍රාදේශීය සභාව පටන් ගත්ත දා ඉඳලා ආපු නියෝජිත මහත්මයෙක් හොරෙක්, වංචාකාරයෙක්, දූෂකයෙක් නොවෙයි ආවට පස්සේ සමාජ ක්‍රමය තුළ නොයෙක් වැරදි වලට යන්න සිද්ධ වෙනවා. සිද්ධ වෙලා තියෙනවා. ඒවගේම තමයි අපේ මන්ත්‍රීතුමාල කිව්වා වගේ මත්ද්‍රව්‍ය වලට දේශපාලන සම්බන්ධයි කියන එක පිළිබඳව. ඒක අද ඊයෙ වුණ සිදුවීමක් නෙවෙයි. දීඝර්කාලීනව සමාජ සම්බන්ධතා එක්ක සිදුවුන සිදුවීම්. වතර්මානයෙත් ඊට අඩු වැඩියෙන් වෙනවා. මත්ද්‍රව්‍ය පිළිබඳව කතා කළොත් අපේ ප්‍රදේශයේ විතරක් නෙවෙයි. මුළු රටේම මහත් ආන්දෝලනාත්මක සිදුවීම් වෙනවා. හේතුව දැන් පොලිස් බලතල වලට මත්ද්‍රව්‍ය වැටලීමට අයිතියක් නැතිලු. නමුත් මහින්ද රාජපක්ෂ අතිගරු ජනාධිපතිතුමන්ගේ කාලේ මතට තිත කියලා වැඩපිළිවෙළක් කරගෙන ගියා. පසුකාලීනව එය අඩාල වෙලා. දැන් අපේ කනට ඇහෙන්නේ කසිප්පු විකිණෙන්නෙ නැහැ කියලා කියනවා. මොකද හැම තැනම කසිප්පු පෙරනවා. මම හොඳ උදාහරණයක් කියන්න කැමතියි. පතිනායක මන්ත්‍රීතුමාත් යම් ස්ථානයක සිටිද්දී, අන්න බලන්න සභාපතිතුමා අර බෙදන්නේ මොනවද කියල බලන්න. මේ මහ දවල් ත්‍රීවීලර් එකක ගෙනැල්ල බෙදුවා. ඒ ප්‍රදේශය කියන්න හොඳ නැහැ. අගෞරවයක් වෙනවා. අන්න ඒ වගේ ප්‍රසිද්ධියේ ඒ කටයුත්ත වෙනවා. ඒව මම හිතනනෙ ඉහළ නිලධාරි දැනුවත්වෙලා, දේශපාලන අධිකාරිය දැනුවත්වෙලා, පොලීසියට ඇල්ලීමේ නොහැකියාව පිළිබඳ, ඒ ඡේද වෙනස් කරන්න පුළුවන්. පාලරීමේන්තුවේ පොඩි ඡේදයක්ලු තියෙන. ඒ ගැන මීට වඩා යමක් මම කියන්න යන්නේ නැහැ. අපේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු කතා කළ ආකාරයට වතර්මානෙ අපි සභාවේ යම් වැඩ කටයුත්තක් කිරීමේදී අතපසුවීම් වෙනවා. වීථි ලාම්පු ලබාදීමේදී ඔබතුමන්ලා කිව්ව වගේ ගොඩක් ප්‍රශ්න ඇති වෙනවා. නමුත් අර කිව්ව ආකාරයට මන්ත්‍රීවරු පුද්ගලිකව කරන්නේ නැහැ. අලුතෙන් දාද්දි මම වුණත් ඒකට අනුමැතිය දීලා තියෙනවා. මොකද අපේ ආථරීක ශක්තිය දුවර්ල මට්ටමක තියෙන නිසා. අපේ හුඟ දෙනෙකුගේ ඉල්ලීම තියෙන්නෙ විදුලිය වීථි ලාම්පු. අපේ සිංහල මිනිස්සු අතරේ තියෙන්නේ සුළු දෙයක් තමයි. තෘප්තියක් ලබන්නේ එයාලා අනිත් ඒව ගැන හිතන්නේ නැහැ. බල්බ් එකක් දැම්මම අන්න ඒකෙ තමයි වටිනාකම තියෙන්නෙ. අපි ඒකට දැන් හුරුවෙලා. අපේ හැම

සභාවම පත්වුණාට පස්සේ මන්ත්‍රීවරුන් යම් ප්‍රතිලාභයක් ලබා දෙනවා නම් වීථි ලාම්පුවක් දුන්නහම. ඒක මැරෙන මොහොත දක්වා ම සිහියෙ තියෙනවා. ඒ අනුව යම් මන්ත්‍රීවරයෙකුට බල්බ් එකක් ඉල්ලලා දෙන්න බැරි වුණාම. අසහනයට පත්වෙනවා. කොට්ඨාශයේ අදාළ ස්ථානයේ ඉන්න කෙනා, එතකොට තමයි අපි දෙන්නම්, මුදල් දෙන්නම් කියලා කියන්නේ. එයාලට අවශ්‍ය අපේ නිලධාරීන් ලවා මේක දම්ම ගන්න. ඉතිං අපි අවසර දුන්නා. නමුත් ඒකෙදි පසුකාලීනව එන බලපෑම් අපේ සභාවට දරාගන්න බැහැ. අපි දැනට ලකුණු කරලා තියෙනවා. විදුලපහන් එක්දහස් හාරසිය ගණනක,ඒ හැර අලුතින් දාන ඒව අලුත් වැඩියා කරන්නෙ නැහැ.ඒක කියල තියෙන්නෙ.අලුත්වැඩියා කරනයනම් අපේ කාමරීක නිලධාරිය යද්දි ඒ අදාල ස්ථානෙ කෙනා ලබාදුන්නොත් අපි අලුත් වැඩියා කරනව.නැතිනම් නැහැ.ඔය මන්ත්‍රීතුමන්ලගෙ ස්ථානවල අපි කිසිකෙනෙකුට කියල නැහැ දාන්න එපා කියල.අපි සහෝදරයො වගේ කටයුතු කරන්නේ. මම දන්නෙ නැහැ එහෙම අසාධාරණයක් සිදු වුණාද කියලා. මම එහෙම කරන්නේ නැහැ. සහබන්දු මහත්තයා ඔබතුමන් හිටපු සභාපතිතුමෙක් ඔබතුමාගේ මැණියන්ගේ නිවස ඉදිරිපිට වීථි ලාම්පුව දැම්මේ නැහැ කියන එකට මම තරයේ විරෝධතාවය දක්වනවා. එහෙම වුණා නම්, එහෙම වෙන්නේ නැහැ. එහෙම වුනේ නෑ කියලා තමයි දැනටත් හිතෙන්නෙ. එහෙම වුනානම් මම කනගාටුව ප්‍රකාශ කරනවා. මම හිතන්නේ නැහැ. අදාළ මන්ත්‍රීතුමා එහෙම කරන්නේ නැහැ. එහෙම කරයි කියලා. මගේ දැඩි විශ්වාසයක් තියෙනවා. කරන එකක් නැහැ කියලා. එහෙම උනානම් මම කනගාටු වෙනවා. අපේ එහෙම බෙදීමක් නැහැ. මේ 26 දෙනාම අපට එකයි.15 දෙනා ගැන කියන්නෙ,ඇත්ත වශයෙන්ම කියන්න ඕන.ඒ 15 දෙනා මූලික කරගෙන කටයුතු කරන්න හේතුව එතුමාල ඡන්දෙන් පත්වුනු අය.මම වගකියනව ඒ අයට. අනික් 12 දෙනාට වගකියන්නෙ නැතත් ,ඒ අය මගෙ ඥාතිවරු,සහෝදරයො වගේ.එතුමන්ලත් මන්ත්‍රී වරු මේ දේශපාලන ක්‍රමවෙදය උඩතමයි ඒ අයට මේ පත්වීමට එන්න බැරිවුනේ.නමුත් 26 දෙනාම මට එක හා සමානයි.මම ඕන වෙලාවක කියනව 15 දෙනා මූලික කර ගන්නෙ මගෙ පහසුව සඳහා.දේශපාලන පක්ෂෙක ක්‍රමවෙදයකට යන නිසා.ඒ අය මූලික කර ගන්නවා මිස ඒ කිසි කෙනෙකුට කියල නැහැ.අනිත් මන්ත්‍රිවරු එක්ක සම්බන්ධ නොවී ඔයාල තනිව යන්න කියල.එතුමන්ලත් එහෙම නැහැ.මම හිතන්නෙ පෘතග්ජන අපේ අතින් වැරදි සිදුවෙනව ඇති.ඒක මම පිළිගන්නව.ඒක නිසා ගරු මන්ත්‍රිවරුනි අපි 27 දෙනාම එක හා සමානව තමයි කටයුතු කරන්නෙ.මම අදටත් සතුටු වෙනව.පත්තරවල බැලුවොත් අනිත් ප්‍රාදේශීය සභාවන්වල හැටියට අපේ සභාව ඇත්තටම ගරු කළ යුතු සභාවක්.මම ඔය සියලු දෙනාටම ගරු කරනව.ඒක නිසා ඒකෙ වරදක් නැහැ.මම ඒක අවංකව ප්‍රකාශ කරන්නෙ.හේතුව අපි ආවෙ යම් කායර්යක් කරන්න.ඒ කායර්ය ඉටු කරන්න නම්,අපි සමගියෙන් සමාදානයෙන් වැඩකටයුතු කරන්න ඕන.අපේ අඩුපාඩු තියෙනව.ඊලගට අපේ මන්ත්‍රීවරු කිව්ව කම්කරුවන් පිළිබඳව.කම්කරුවන් 07 නෙයි ඉන්නෙ.අද කම්කරුවන් පිට්ටනියෙ වැඩ,ඊලහට පොලේ වැඩ.එයින්දෙදෙනෙක් විතර සමහරදාට අසනීපයි.ඇත්තටම වැඩ කරනව ඒ මිනිස්සු.නැත්තෙත් නැහැ.එයාල කරන එක තමයි ලෝකයාට පෙනිල.අපට පිළිගැනීමක් ඇති වෙන්නෙ.ඇත්ත කතාව.එයාලට අපි දොස් කියනව.නමුත් එයාල දැන් මේ අවස්ථාව වෙන කොට මාපලගම පිට්ටනියෙ වැඩ.උඩුගම පොල වැඩ කළා.දෙයක් දවසෙන් දෙකෙන් කරන්න ගියාට ,ඇස්තමේන්තු හැදුවට සමහර වෙලාවට දවස් 10 ක් 15 ක් යනවා.මේ කාලගුනෙත් එක්ක,වෂර්ාවත් එක්ක හරියන්නෙ නැහැ.විදුලියත් එහෙමයි. මේ මොහොත වෙනකොට හැම කොට්ඨාසයකම ගිහිල්ලා තියෙන්න ඕන. නමුත් කාලගුනයත් එක්ක බැහැ.

ඒ මැෂින් එක කැඩිලා. ඒ අවස්ථාවේ අපි අසරණ තත්වයට පත්වෙනවා. මේ වෙනකොට විදුලි කාමරීක නිලධාරී මහතා අර ලොකු ලයිට් ගලවලා අලුත්වැඩියා කරමින් ඉන්නවා. යථාකාලෙදි මම හිතන්නෙ විදුලිය පිළිබද ඔබ සියලු දෙනාටම සතුටු විය හැකි ප්‍රතිඵලදායක කටයුත්තකට යොමු වෙන්නම්. ඒ ගැන මම මීට වඩා කියන්නෙ නැහැ.

ඒ වගේම අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා පුහුණු නිලධාරි ගමන් වියදම් ගැන කතා කළා. ඒ ඇවිල්ල හැමදාම වගේ දෙන්නෙක් තුන්දෙනෙක් පුහුණුවීම් වලට යනවා. චක්වැල්ල පුහුණු කිරීම් මධ්‍යස්ථානය හැමදාම නම් කරලා එවන නිලධාරීන්, ඒ අයගේ ගමන් වියදම් අපි දෙන්න ඕන. ගිය මාසේ රුපියල් තිස් පන්දාහක් විතර වැය වුනා.

ඒ වගේම ගම්පෙරළිය ගැන කතා වුනා. ඇත්තටම හොඳයි වැඩක් වෙන්න. දැන් මෙතුමන්ලා අපෙන් ඇහුවා. අපි කට්ටිය විතරද බෙදා ගන්න කියලා නැහැ. අපි එහෙම නැහැ. නමුත් ගම්පෙරළිය කරන්නේ ඒ විදියට. ගම්පෙරළිය දෙන්නෙත් එක්සත් ජාතික පක්ෂයේ මහත්වරුන්ටයි. ඒ වගේ තමයි ලොකු ප්‍රශ්නයක් වුනා. පහුගිය දවස් වල කටු ප්‍රශ්නය, ඒ පිළිබඳව අපේ බල ප්‍රදේශයේ කටුපොල් ප්‍රශ්නය ගොඩක්ම බලපානවා. මොකද කටුපොල් විරෝධතාවයක් නොවෙයි අපේ තියෙන්නෙ, 20% ක කටුපොල් සිටුවීමේ ධාරිතාවය 86% කට වැඩිකරලා. අපේ බල ප්‍රදේශයේ විශේෂයෙන් නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වටවල වතු සමාගම තමයි එහෙම කරලා තියෙන්නෙ. අපි ඒකට විරෝධය දක්වනවා. දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ කතා කරලා මේක නැවැත්තුවා. එක නිත්‍යානුකූල මට්ටමේ ආපු නැති නිසා තවමත් වගා කරනවා. එහිදී සභාවක් හැටියට පසුගිය දවසක ඒ සම්බන්ධ කළමනාකරණ මහත්වරු කැඳවලා කතා කළා. ඔබතුමාලා කීප දෙනෙකුත් සහභාගි වුණා. අපට ඕන 20% විතරයි. අසූගානට වැඩි කරපු එකටයි අපේ විරෝධය. ඒ නිසා ඉදිරියේදී සභාවක් හැටියට යම් ක්‍රියාමාගර්යක් ගන්න වෙනවා. සමහර අය කියනවා පරිසරයට හානිය කියලා. අපේ දැනුමේ හැටියට නම් මෙය පරිසරයට හානි දායකයි. මොකද අපේ බල ප්‍රදේශයේ මන්ත්‍රීවරු දන්නවා, දැනුවත් වෙලා තියෙනවා. මේවට අපි කතා නොකලොත් අපේ මිනිස්සු අපිට දොස් කියනවා. ඒ වගේම යම් යම් ස්ථානවල අනවසර ඉදිකිරීම් පිළිබඳ අපට චෝදනා එනවා. අපි බලන්නේ නැද්ද කියලා. ඒ ගැනත් අපි ඉදිරියේදී යම් වැඩපිළිවෙළක් කරගෙන යනවා.

ඒ වගේම අර කසල බද්ද පිලිබඳවත් ඉදිරියේදී කටයුතු කරනවා. ඒ පිළිබඳව මන්ත්‍රීවරු දැනුවත් වෙලා ඒ අදාළ ආයතන, අදාල සංගම් දැණුවත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. එහෙමනම් අද සභාවට පැමිණ සභාව පවත්වන්නට සහයෝගය දුන් දීලා කටයුතු කරපු, උප සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලට ස්තුතිවන්ත වෙමින් සභාව මෙහෙය වන්නට අපට සහයෝගය ලබාදීම පිලිබඳව අපේ ලේකම්තුමිය ඇතුළු සියලු දෙනාට සුබ අනාගතයක් ප්‍රාථර්නා කරමින් සභාවේ වැඩකටයුතු නිමා කරනවා.

සභාපති,

නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                    දිනය :- ..............................